සියයම් සහිත

දෙහලකුරු නාවිදුරුව.



රූපයින්ගේ ශරීරලක්ෂණ බලා ගුහා ගුහ

ගත හැකි එකම අනගි පොත මෙයවේ

සිංහල සහිත

දෙහලක්ෂණ විද්‍යාව.

(කාණ්ඩ තුනකින් යුත් සම්පූර්ණ පොත.)

කොළඹ විද්‍යෝදය මහා විද්‍යාලයෙහි උප ප්‍රධානාචාර්‍යවරයකු වැඩබලන අති ගෞරවාර්හ ධර්මකීර්ති ශ්‍රී වාග්විචාරාචාර්‍ය

බිහල්පොල ශ්‍රී දේවරක්ෂිතාභිධාන

ප්‍රධාන සඛ්‍යනායක සවාමීන්ද්‍රයන්වහන්සේගේ හා

ජේ. ඇස්. රාජසුන්දර

වෙදඅරච්චි මැතිතුමාගේද ශිෂ්‍ය

වෛද්‍යාචාර්‍ය ජී. බී. ගුණදාස මහතා

විසින් සම්පාදිත යි.

සී. ඇස්. මුදන්නායක මහතා

— විසින් —

අනුල යන්ත්‍රාලයෙහි අච්චුකර්වා ප්‍රසිද්ධකරණලදී.

1953.

(All Rights Reserved by the Publisher)

මිල රු: ४ . 00 සි.

සංක්ෂේපනීය.

සමුදු නම් මහර්ෂිහු විසින් ලොකාර්ථය සඳහා නිර්මාදිත විසඟඹ ශාස්ත්‍ර සඩ්ඛ්‍යාත දෙග ලක්ෂණ විද්‍යාව වූකලි පුරාණ යෙහිදී භාරතීයයන් හා යුරෝපියන්ගේ අතරෙහි මෙතෙවිත් ප්‍රකටවූ පැවසී සත්‍රීපුරුෂයන්ගේ දෛවාදෛවය මනාසේ හඳුන්වනු ලබන මහැඟි ශාස්ත්‍රයෙකි. එහෙයින්ම පෞරාණික ශාස්ත්‍ර රසිකයෝ සියළු කාර්‍යයෙහිම ලක්ෂණ ශාස්ත්‍රය ගරුකොට සැලකූහ. ශාස්ත්‍රලෝකීන්ගේ අභ්‍යුදය සම්මත විපරිනාම ධර්මයද බලපවත්වනුයේ වොරදමින් තුබුණු මේම ශාස්ත්‍රය අප ලක්දිවෙන්ද අනුක්‍රමයෙන් අතුරුදහන් වන්නට පටන්ගෙන. පෞරාණික භාරතීයයන් විසින් මෙම ලක්ෂණ ශාස්ත්‍රය කෙතරම්දුරට ආදරයෙන් පරිශීලනය කළාහුදැයි උමංඟ ආදි පැරණි පොත පතින් මනාව ස්ථිරවේ. මෙම ශාස්ත්‍රය සත්‍රී පුරුෂයන්ගේ අඹක සටහණින් සියළු දෛවාදෛවය නිශ්චයකිරීමට දර්පණතලයෙක් සදෘශවේ. ඒ බව අමරාදේවී, පණ්ඩුකාභය, කුමනකොමකාදී ඓතිහාසිය ප්‍රවෘත්තීන්ගෙන් වඩාත් පැහැදිලිවන බැවින් අප විසින් සාති විස්තරයක් මෙහිලා දැක්වීමට ප්‍රපංච නොවනු.

තවද මේම ග්‍රන්ථ සංස්කරණයෙහිදී දෙග ලක්ෂණ විද්‍යාව පිළිබඳ පොත්පාත් සොයාගැනීම අති දුෂ්කර කර්තව්‍යයක්වූයේ නමුදු අපගේ උත්සාහය නොඅඩුවූයේම මෙසේ ප්‍රකටීකරණයට හැකි විය. මේම ශාස්ත්‍රයට අයත් ශ්ලෝක සියගණනක් අත්හැර එහි අදහස් පමණක් ගෙන සුබාවබෝධවන පරිදි කාණ්ඩ 3 කින් හා පුම්නිරි රූ සටහන් රාශියකින් සම්පූර්ණකොට ලියවිල්ලකින් සමපා දනය කළ බැවින් භාෂාරීතීන් පිළිබඳ සඳෙහ්කැන් ඇතිවන්නට පිළිවන. එහට විමත්හු සමාධාන භජනය කෙරෙන්මැයි අපි සලහනු.

මෙම ග්‍රන්ථය පිළිබඳ සියළු අයිතිවාසිකම් නීති ප්‍රකාරව විද්‍යා ධාර පොත් වෙළඳශාලාවේ අයිතිකාර ඩී. ඇස්. මුදන්නායක මහතාට පැවරූ බවද මෙයින් කියවක් උපුටාගැනීම තහනම් බවද සඳහන්කරනු.

මව්-වෛද්‍ය,

ජී. ඩී. ගුණදාස.

පටුන.

---

1 වන කොණ්ඩය.
(පුල්ලිංග ආඛ්‍යාත)

හිස
හිසකෙස්
නළල
නළලේ ලකුණ
ඇස්බැම
ඇසිපිය
ඇස්
කන්
නාසය
කොල්
දත්
දිව
දෙතොළ
මුඛය
කටාව
කටහඬ
කම්මුල්
නිකට
ග්‍රීවය නොහොත් කුලල
මුහුන.

---

2 වන කොණ්ඩය.
(ස්ත්‍රී ආඛ්‍යාත)

පද්මිනී
චිත්‍රිනී
සංඛිනී
හස්තිනී
හිස
හිසකෙස්
කොණ්ඩය
නළල
නළලේ ලකුණ
ඇස්බැම
ඇසිපිය
ඇස්
නාසය
කන්
කම්මුල්
කොල්
දත්
දිව
දෙතොළ
කට සහ කටාව
කටහඬ
නිකට
මුහුන
බෙල්ල
දෙවුර
දෙඅත්
දෙඅත් ඇඟිලි
හස්ත රේඛා සටහන්
ලෑමද
පියවුරු
උදරය
දෙකිඹිල්ල සහ දෙඇල
පිට
තුනවිය හා පිඬුමස
ඉනවිය හා දෙඋකුල
නාභිය හා සටිඹහ
යෝනිය හා වසිතිය
දෙකලව
දෙදන
දෙකොණ්ඩ
දෙඇස්වට
හිඳුම
පිටිපතුල්

යටිපතුල්
දෙකකුල් ඇඟිලි
පයේ සීයා
ගමනාගමන
මෘදුභාවත්වී
අවෘදුභාවත්වී
වැන්දඟු සත්‍රී
මෛත්‍රී සත්‍රී
වද ලද
කුලහණ
දුසී

3 වන භාණ්ඩය.
(ප්‍රමීඛ්‍යාය)

සසවඟියේ පුරුෂ ලක්ෂණ
මිගුවඟියේ පුරුෂ ලක්ෂණ
වෘෂභවඟියේ පුරුෂ ලක්ෂණ
අශ්වවඟියේ පුරුෂ ලක්ෂණ
හිස
කිරුනෙත්
තලල
තලලේ ලක්ෂණ
ඇස්බැම
ඇසිපිය
ඇස්
භාෂය
කන්
කම්මුල්
දෙතොල්
දත්
දිව
දෙතළු
කට සහ කථාව
කවහඬ
නිකටේ ලක්ෂණ
මුහුණ
බෙල්ල
දෙඋර
දෙඅත්
දෙඅත් ඇඟිලි
ලැමද ලක්ෂණ
උදර ලක්ෂණ
දෙකිසිල්ල
දෙඇල
පිටේ ලක්ෂණ
දෙවුකුල හා ඉඟටිය
තුනටිය හා සටිවම
භාගිය ලක්ෂණ
පහත බඩ
ලිඟුවේ ලක්ෂණ
වෘෂණ.
දෙකලවා
දෙදත
දෙකෙණ්ඩා
ඇස්මට හා වළලුකර
මිලුඹ
පිටිපතුල්
යටිපතුල්
පඇඟිලි හා සීය.

විවාහය සම්බන්ධ විශෙෂ කරුණු
ආශ්‍රිත සිංහල භාෂා.

සිතුවිලම් සහිත

දෙහලක්ෂණ විද්‍යාව.

ශ්‍රී ඝනාය නමඃ

ශ්‍රී ඝනං ප්‍රණිපත්‍යාහං ජගන්නාම්ඵිඩයේ
දෙහලක්ෂණවිද්‍යාං විභාමතමාශ්‍රිත්‍ය වක්ෂ්‍යේ

පුරේ නානාං කෘතශුභාශුභකම්ණා යත්
සාන්‍යත්‍රජන්මනි භවන්ති ඵලාඵලානි
අඩ්ගානාසි තානී වපුර්භා ප්‍රවිභාවයන්ති
සාමුද්‍රකං ග්‍රන්ථමහං කථයේ නදීයම්

ශ්‍රීමත්වූ මනුෂ්‍යලෝකාන්තර්ගත සකල සත්ත්‍ව පුරුෂයන්ගේ ශරීර ලක්ෂණ කවර ප්‍රකාරයකින් පිහිටා නිබේදැයි තම තමන්ටම එහි තත්ත්වාර්ථය දැනගන්ට හැකිවීම ඉතා ප්‍රීතිමත් කාරණයකි. පූර්වයෙහි තම තමන් විසින් කළ කුශලාකුශල කර්මයන්ගේ ඵලය ප්‍රකාශ කරණ ලකුණු මවුකොවුන්ගේ ශරීරයන්හි උත්පත්තියේ දීම සටහන්වීම ධර්මතාවයකි. මේ ලක්ෂණ ශාස්ත්‍රය ඉතා විශාල වශයෙන් සාධිවරයන් විසින් නොයෙක් ග්‍රන්ථයන්හි දක්වනලදි. මේ ශාස්ත්‍රය මනාව දැනගත්කල්හි කිසිකලෙකත් තුදුවුකෙනෙක් දුටු පමණින්ම ඔහුගේ සවභාව මෙසේ යැයි මෙයින් ඒකාන්තයෙන්ම දැනගැකිවේ. යමෙකුගේ මුහුණ බැලූකලෑ ඇස්, කන්, නාසා ආදියෙන් ඔහුගේ සවභාව චරිතය දැනගන්ට හැකිනම් තොරම ප්‍රීතිඝක්ද? ප්‍රශෝජනයක්ද? එහෙයින් මෙයින් එය ඉටුකරන්ට වැයම් කරමු.

ප්‍රථමයෙන් මෙය විස්තර විසින් ඊළඟරයාගෙන් ඇසූ ප්‍රශ්න යන්ට උත්තරදීම වශයෙන් ප්‍රකාශ කරණ ලදි.

පසුව මෙය සාමුද්‍රික නම් සාධිවරයා විසින් ප්‍රකාශකරන ලදින් සාමුද්‍රිකා නම් විය. එබැවින් ජගදුත්පත්ති විස්තර අප විසින් නොයෙක් ග්‍රන්ථයන්ගෙන් කරුණු උපුටාගෙණ මෙය ලියන්නු ලැබේ.

එනම්, මෙහි ලක්‍ෂණ විභාගය කොවුන් හට විස්තරයෙන් පරිච්ඡේදය කොටද තිබේ. ඒ ඒ ස්ථාන සම්බන්ධ කියවෑ බැලීමෙන් දුටු දුටු වන්ගේ හෝ තමුන්ගේ හෝ ක්‍රියා රාශියක් මනසේ දැනගත හැකිවන අයුරින් සත්‍රී පුරුෂයන්ගේ වෙල්ලෙන් උඩ පමණක් පිහිටි දෙය ලක්‍ෂණ මේ අධ්‍යායයෙහි කියනු ලැබේ.

එනම්:—

1	හිස	11	දත්
2	හිසකෙස්	12	දිව
3	නළල	13	දෙතොළ
4	නළලේ ලක්‍ෂණ	14	මුඛය
5	ඇස්බැම	15	කටාව
6	ඇස්පිය	16	කටහඬ
7	ඇස්	17	කම්මුල්
8	කන්	18	නිකට
9	නාසය	19	ග්‍රීවය කොකෙස් කුරුල
10	නොල්	20	මුහුණ

---

1. සත්‍රී පුරුෂයන්ගේ හිස

ගමෙක්හට ලොකුවූ හිස පිහිටියේ නම් ඉතා යහපත් හිති භුවණ හා බොහෝ දරාසුහම්පා හකියද, සේප්වන්තභාවය හා ජනප්‍රධාන භාවයද වේ.

වටවූ කුඩාගිහ පිහිටියේ නම් කෙළීසෙල්ලමෙහි ප්‍රියශීලභාවය ද යමක් ඇසූ දුටු පමණින් ධාරණශක්තියද, වංක අදහස්ද, නම් සිතේ එකක් තබාගෙණ අනුන් අතර වෙන යමක් පවසන හිරි නැත්ද ඇතිවේ.

පස්සට පැන ගියාක් මෙන් ගිහ පිහිටියේ නම් නියුණු ගතිය හා දක්ෂභාවයද, යමක් පහසුවෙන් ඔබවාහ කොහරන බවද, යමක් වෙන්වපෙර මෙබදුදෙයක් වන්නේයයි කැගීයනබවද වේ.

ගිසේ දෙසෙළවර වළවැදුනාක්මෙන් පිහිටියේනම් යම් යම් දේ ගිතෙහි මැනවින් දැරීමද, දෘඪලෝභයෙන් ක්‍රියාකරණයද ඇතිවේ.

ගිස්මුදුන උස්මහම් කරුණාධිකභාවයද, ශ්‍රද්ධාවන්තභාවයද ධනසුඛලාභයෙහි හෙතුසම්පන්නතාවද, අන්තරායක් නොවන අසුරින් සහුරන් මැඩපියා ඔවුන් හජ්ජාය කිරීමේහි සමර්ථභාව යද ඉතා නියුණු නුවණින් ක්‍රියාකිරීමද ඇතිවේ.

---

2. සත්‍රී පුරුෂයන්ගේ ගිහිකෙස්.

ඉතා කාලවණීවත්වූද, නොවටූද වකුටුවූද යන මෙයින් යම් ආකාරයක ගිහිකෙස් පිහිටි අය වෙත්නම් ඔවුහු මත්පැන් බී මෙහි ඇලුනෝද, සණ්ඩදබරයන්හි ප්‍රියවූවෝද, වඤ්චලව්‍යාඝ කෘරෝද්‍ර ගති ඇත්තෝද වෙත්. ඔවුහු සුශීලාචාරවත් නොවූවාහුද යම් යම් කටයුතු ගැන බොහෝ උත්සාහවත් වූවාහුද, ප්‍රවේශම් කරණ මුදලින් තම දියුණුවට කටයුතු නොකොට නිෂ්ප්‍රයෝජන වියදම් කරන්නාහුද වෙත්.

දික්වූ දුඹුරුවන් සිලුටු ගිහිකෙස් පිහිටි තැනැත්තෝ මුරණ්ඩු සිතැත්තෝද සත්‍රින්ට ඉතා දයාදරවත්වූවෝද, අම්තු සහ අපූරු දේවල් ගැන බොහෝ ආසා ඇත්තෝද, යමක් කරන්නම් පවත් ගත්කලෑ එය ඉතා ඕනෑකමින් සඵලකරන්නෝද, ඉතා ශරීර ශක්තිය ඇත්තෝද, මද්‍යපානයෙන් ජීවිත විනාශය නොවූ මොත් චිරකාලයක් ජීවත්වන්නෝද වෙත්.

නොවටූ යන ගිහිකෙස් පිහිටියේනම් කෝපවූවිට පුරුෂයා පහරදීමටත් සත්‍රී පරෝස්බස් කීමටත් සැරයේ. මෙයේ ඉක්මන් ළමෙන් අකාලයවත් ජීවිතයක් නසාකරන්ට හිදුවන්නේයයි දතයුතුයි.

3 ස්ත්‍රී පුරුෂයන්ගේ නළල.

යමෙක්හට අඩසඳක් සමාන නළල පිහිටියේනම් නිදොස් ගතියද, අදහස් සඵලවීමද, හේතුවන්නවීමද, යම් යම් දේ ගැන මැලිසිත් උපදවා ක්‍රියා කිරීමද වේ.

වටවූ සිලුටුවූ විශාල නළල පිහිටියේ නම් ත්‍යාගවන්මදභී අවංකවීමද, යහපත් ගුණඇතිවීමද, නොදුරු නැණ නුවණ ඇතිවීමද, අධම අයට හෝ අධම ක්‍රියාවලට එකඟනොවන දැකැමතියද, ප්‍රතිඥාරෝධයක් නොකරනබවද, අවංක ප්‍රේමයෙන් ක්‍රියා කරනයද, තරමක් ශරීර ශක්තියද ඇතිවේ.

නළල මැද පැතලිව පිහිටියේනම් නිෂ්ඵල කීර්ති ප්‍රශංසා ලාභයෙහි ආශාවද, නිර්ජීතගතියද හා අනුකම්පා රහිතවීමද, තමන්ට ප්‍රශංසා ලාභය සඳහා අනුන්ගේ රහස් සෙවීමෙහි නිතර උත්සාහ කිරීමද ඇතිවේ.

ඇස්බැම සිට ඉදිරියට තෙරූ නළල පිහිටියේ නම් උඩඟු සිත් ඇතිවීමද, කපටි ගතියද, වාදවිවාදවලදී ඉතා ඉක්මනට කිපෙන ගතියද, බැටවෙරයද, නොකවයුතුකම්වලින් සතුරන් සාදාගැනීමද, නිතර සුලුලෙඛවලින් පෙළෙන ගතියද වේ.

නළලේ දෙකෙවර වළවැදී පෙතැලිව නාසයේ මූල සිට ඉහලට ඉරක් සමාන ලකුණක්ව දෙකට බෙදුනාක්මෙන් පිහිටියේනම් රෞද්‍රවූ නිර්ජීතගතියද, නිෂ්ඵල කටයුතුවල යෙදී ක්‍රියා කිරීමද, බොහෝ නැණවත් අයෙකු මෙන් ලෝකයාට ඇතවීමද, පැසසුම් ලැබීමෙහි ආශාවද, ප්‍රයෝග සාමර්ථ්‍යයද, යමක් හැන ඉක්මනට කිපීමද, කෙලෙස් මැඩපිය නොහැකි රළුගතිය හා වඤ්චලවූ අදහස්ද, සණ්ඩුදබරවලටප්‍රියවූ මුරණ්ඩුසිතක්ද ඇතිවේ.

---

4. ස්ත්‍රීපුරුෂයන්ගේ නළලේ ලකුණු.

යමෙකුගේ නළලයෙහි සංඛ්‍යාවඩය, සඩසත්‍රිකය, වර්ත්ත, ත්‍රිශූලය, අංකුශය, ධ්වජය, පත්‍රාකය ඡත්‍රය, උරගපෙකය යන මෙයින් යම්කිසි ලක්ෂණයක් පෙණෙනම් තේජවන්තවීමද, කීර්ති මත්වීමද' ජනප්‍රධානවීමද, සෙනෙවි තනතුරු ලැබීමද තැන හොත් ඒ හා සමාන උසස්බවට පැමිණීමද වේ.

චක්‍රාකාර ලක්ෂණයක් පිහිටියේනම් දෙව්බඹුන් පිදීමෙහිද දන්දීමෙහි හා ධර්මශ්‍රවණයෙහිද, ශීලසංවරණයෙහිද ඇලුනේවේ.

දෙහ ලක්ෂණ විඳුව.

දෙකට බෙදුනාක් මෙන් ලලාටය පිහිටියේනම් උපභෝග පරිභෝග සම්පත්ද, පරම්පරාගත කුලය හා ධනයද ඇතිවේ.

තළල මැද චන්ද්‍රරශ්මියක් සමාන දීප්තිමත්ව බැබළේනම් ධනසුබලාභය හා රාජමල්ලහවයවේ. බොහෝ රේඛා පිහිටි තළ ලෙහි සුළුපට රෝඛුඇතිවීමද, පිරුණුඅකාරයද, තළලමුදුනෙන් කෙරා පිහිටීමද, යන මෙහින් යම්බදු තළලඇතිවිනම් නිරන්තර සෙන් කෑමාශාව හා එයින් පෙළීමද දුටුවන් ප්‍රියකරවනාකාර ශරීර ලක්ෂණයද, සන්සුන් හසියෙන් යුක්තව ක්‍රියාකරනයද රළුවූ අදහස්ද ඇති වේ.

රෝඛු සහිත තළල පිහිටියේනම් දුක් දෙමිනස් හා දිළිඳුවන් නෝයයි දනයුතුයි.

---

5. ස්ත්‍රී පුරුෂයන්ගේ ඇස් බැම.

විසුලුවූ ඝනරෝඛු සහිත ඇස්බැම පිහිටිඅය වෙත්නම් මවිහු දබර සහිතවූද, නඩුපත්හි ඇලුනාවූද, කුහකවූද, ලජ්ජානැත්තාවූද, මෝඩවූද, මිත්‍රකම් අහවා තම ලාභය අපෙක්ෂකවූද, මත් පැන් බීමෙහි දැඩි ආශාඇත්තාවූද, මලානික මුහුනක් ඇත්තාවූද අය වෙත්.

දිසින් පිහිටි ඇස්බැම හා එසේම රෝඛු සහිත ඇස්බැමින් යුක්තවූවෝ බෙලහිනවූද, නිරාස්‍රීක දේවල්ගැන මහන්සි දරන්නා වූද, නිශ්ප්‍රයෝජන කථාකරන්නාවූද, නිකරුණේ කාලයෙපය කරන්නාවූද, අසභ්‍ය පැවතුම් ඇත්තාවූද, නිරන්තරයෙන් අනා චාර කැසුරුම් ඇත්තාවූද යම් යම් දේ ගැන -නොඉවසනාකාර යෙන් ක්‍රියා කරන්නෙක්ද වෙත්.

අවිස්තීර්ණ ඝනවූ රෝඛු සහිත භ්‍රැමයුග්මයෙන් යුක්තවූවහු යහපත් සිහි ක්‍රුවත ඇත්තාවූද, සොම්සෙල්ලමෙහි මද ඇලුම් ඇත්තාවූද, අඩුන්ට අන්ධාරය කිරීමෙහි වියඤ්ඤ ඇත්තාවූද යුක්තිසාධනයෙහි බොහෝ වෙහෙස දරන්නාවූද, මිත්‍රයන් කෙරෙහි අවංකවූද, දයාබරවූද, නාඤඤවත්වූද, ආරෝහහා ඇත්තාවූද අයවෙත්.

කුඩාවූ ඇස්බැම හා සුළුපට රෝඛු පිහිටි ඇස් ඇත්තෝ යම් යම් දේ ගැණ ධෛර්යවිමත්වූද, වංකොඩාන ඇත්තාවූද, ඉගෙණීමෙහි ආසා ඇත්තාවූ කළුවත් ඉන් සාරථලයක් නොලබන්නාවූද, ප්‍රඥාසා ලාභයෙහි ආසා ඇතිනාවූත් ඒ සඳහා මහෙනත්සාහිකවූද, දුටුවන් ප්‍රියකරවන මෘදුශරීරයකින් යුක්තවූද අයවෙත්.

දැඩිය තඟන අයුරු මොලොක්වූ මැදුම් කන් පිහිටියේ නම් ප්‍රඥාබුද්ධිඥයන් ඇතිවීම හා ධනයින ගෘහයද වේ. ලම්බකර්ණ පිහිටියේ නම් සකලෛශ්වර්‍යය්‍ය පරිපූර්ණතාව වේ, කුඩා කන් පිහිටියේ නම් භෝග සම්පත් ලැබේ. තුන තහරට බිඳුනු ආකාර ලොකු කන් පිහිටියේ නම් වඩාකඩ්‍යාග ඇතිවීමද, තෙජවන්ත වීමද, සැප ලැබීමද වේ.

රෝඹු සහිත කන් පිහිටියේ නම් අවබක ගතිය ඇත්තෙක්ද සත්‍ය වචන කියන්නෙක්ද වේ.

පුරුෂයන්ගේ කන්වල රෝඹු පිහිටීම විශෙෂයෙන්ම ඉතා යහපත් ලක්ෂණයක් නමුත් ස්ත්‍රීන්ගේ කන්වල රෝඹු පිහිටීම වැන්දඹුවීමේ හා දිළිඳුවීමේ ලක්ෂණයකැයි දත යුතුයි.

---

9. ස්ත්‍රී පුරුෂයන්ගේ නාසය ගැන.

යමෙකුගේ නාසය මුදුන සමතලාවී දෙකෙළවර පැතලිව පිහිටියේ නම් උඩඟු සිතැතිබවද, කපටිවූ අනුවණ ගතියද, ඊර්ෂ්‍යා මානඩාකතාවද, වපල සවභාවද ඇත්තේය.

නාසය මැද උස්ව පිහිටියේ නම් වඩාඩ්‍යාග ඇතිබවද, සඟඩු දඹරයන්හි ප්‍රිය සවභාවද, ධර්මශාස්ත්‍ර ඉගෙණීමෙහි අනුවන බවද, කථාවෙහි සමර්ථභාවය හා අහංකාර භාවයද වේ.

කුඩාවූද, සිහින්වූද, උල්වූද නාසය පිහිටියේ නම් ප්‍රඥවත් වීමද, චාපල්‍යයද, ක්‍රෝධ චිත්තයෙන් ක්‍රියාකරණයද, අනුන්ගේ ඔපදැප කීමෙහි ඉතා ආසාව හා අදහස දැනගැණීමෙහි උත්සාහ වත්භාවයද, අනුන්ගෙන් අපවාද ලැබීමද, ප්‍රයෝගයෙහි දක්ෂ භාවයද වේ.

උල්වූ නාසය හා කුඩා නාස්පුට පිහිටියේ නම් ධර්මිෂ්ඨ සවභාවයද, අනුන්ගේ උපදෙස් තොපිළිගෙණ තම නුවණින් දියුණුවට කටයුතු කිරීමද, යම් යම් දේ ගැන තීක්ෂණ දෙනයද ඇතිවන්නේ යයි දතයුතුයි.

---

10. ස්ත්‍රී පුරුෂයන්ගේ තොල්.

යම් තෙනෙක්හට දීඝවූද, සනවූද, මෘදුවූද තොල් පිහිටියේ නම් යම් යම් දේ ගැන ඉක්මනට රැවටෙන ගතියද, ප්‍රඥාබුද්ධිඥයන් සථලවීමද, රාගාධිකවීමද, නිතරම වංක අදහස් ඇතිවීමද, නිතර තොසතුටු මුහුණ ඇතිවීමද, යහපත්මග කටයුතුකිරීමේ උත්සාහ සහිත බවද වේ.

උඩුතොලට වඩා යටිතොල මහතින් හෝ දිගින් වැඩිවී නම් නිෂ්ඵල වචන කීමද, නිරාඩම්බර උස්කිරීමෙහි බොහෝ ආශාවද ප්‍රයෝග සටහපව ක්‍රියාවන්හි දක්ෂතාවයද ඇතිවේ

එකසමානවූම දෙතොල පියිවිමේ නම් සාධාරණ ක්‍රියාකිරීම හා තීක්ෂණ ප්‍රඥවද ඇති වේ.

තුනීව මොළොක්වූ දෙතොල එකිටියේ නම් සභා ප්‍රබෝධක කථාවන්හි සාමර්ථ්‍යයද, සුපරික්ෂාවෙන් ක්‍රියාකිරීමද, සෞඛ්‍යවත් භාවය හා රාගාධික්‍යයද ඇති වේ

තුනිවූ ඇතුලට හිලුනු ආකාර තොල් පිහිටියේ නම් රෞද්‍රවූ අදහස් ඇතිබව හා උත්සාහවත් භාවයද, ධාර්මික අයෙකුමෙන් ලෝකයාට අහිත කිරීයුතු කරණබවද ඇති වේ.

---

11 ස්ත්‍රී පුරුෂයන්ගේ දත්.

සියුම්වූ දෙසීසක් දත් ඇති තැනැත්තෝ භාග්‍යසම්පන්න වෙති. එක්සීසක් දත් ඇත්තෝ භොග සම්පත් ලාභීහු වෙති. සමසීසක් දත් ඇත්තාහු සුඛිත වෙත්. එකුන්සීසක් හෝ ඊට අඩුවූ දත් ඇත්තාහු දිළිඳු වෙත්.

සමෙකුගේ යටි ඇන්දේ දත් වැඩිවූනම් ඉඩිබු විනාශය වේ. උඩුඇන්දේ දත් වැඩිවූනම් ධර්මිෂ්ඨ සවභාව වේ. දෙ ඇන්දේම එකසමානව දත් පිහිටියේනම් අති ප්‍රඥාවන්ත.

උල්වූද, අවුල්වූද, විකාරවූද, ඉදිරියට නෙරා බෝල්ලා සහිතවූද, බොහෝ මහත්වූද, ඉතා සියුම්වූද, කසටවණ් හෝ කාලවණ්වූද, දුරස්ථාවූද, වක්‍රවූද යන මෙයින් යම් ආකාරයක දත් පිහිටියේනම් ඉෂ්ටඵලදායි නොවේයයි දතයුතුයි.

---

12. ස්ත්‍රී පුරුෂයන්ගේ දිව.

යමෙක්ගේ ලේවන් සිහින්වූද, රතුවූද, සිහින්වූද යන මෙයින් යම් ආකාරයක දිව පිහිටියේනම් ඔවදන් දීමෙහි සමත් බවද, ප්‍රියවචන කීමෙහි හා සපිය විසුදීයෙහි දක්ෂතාවයද, පිනැතිබවද වේත්. කාලවණ්වූ හෝ කෙල්මැලිවන්වූ දිව පිහිටියේනම් ප්‍රලාපයෙහි හා විපලවචනයෙහි සමර්ථතාවයද, වෙහෙරවූ විපලතාවයද වේ. ඒත්වා මධ්‍යයෙහි නීලවණ් සවභාවක් හෝ කාලවණ් සවභාවක් පිහිටියේනම් සතුටු දබරයන්හි ප්‍රියභාව හා

රළුවැදුන් සිමෙහි ඇලුනුබවද වේ. දෙතට බෙදුනාත් මෙත් ඇත්‍රවණ්වූ මහත් දිව පිහිටියේනම් සේලාම්කිම් හා සම්පත් විනා නසද, උදහරණ සහිත කථාකිරීමද, සවල්පදෙග විශාලලෙස පතුරුවා හැරීමද, දෙබසළුබවද ඇතිවන්නේය.

වදමල් බදු රක්තවණේ ජිව්වා පිහිටියේ නම් ඒකාන්ත යෙන්ම මනුෂ්‍යත්වනා බැව් දනයුතුයි.

---

13. සඳු පුරුෂයන්ගේ ලක්ෂණ

යමෙක්තව පියුම්පහන හෝ ෙළුම් මදුලහ වණිවත් උඩු තල්ල පිහිටියේ නම් බොහෝ සම්පත් ලැබීමද, අතිරක්තවණ් වූ උඩුතල්ල පිහිටියේනම් ධනවත්වීමද, බොහෝ කරදර දුක් ඇතිවීමද යන මේ ඔහි පිහිටන්නේය.

රතු තළු මුසුව උඩුතල්ල පිහිටියේනම් දුසිරිතෙහි ඇලුම් බව වේ. ඇත්‍රවණ්වූ හෝ කාලවණ් දෙතල්ල පිහිටියේනම් ඉතා දුක් ලැබීමද වේ. රක්තවණ් හෝ කහාවණ්වූ යටිතල්ල පිහිටි යේ නම් ප්‍රණ්‍යවත්භාවය වේ.

සංඛ චක්‍ර අවි ත්‍රිශූල අංකුශ පද්ම කිරිටාභරණ යන මෙයින් යම් කිසි ලක්ෂණයක් උඩුතල්ලේ පිහිටියොත් ඇසිසුරු ලැබෙන බවද චක්‍රවත්භාවය හා හේතුසම්පන්නතාවියද වේ. නිලවණ් යෙන් හෝ කාලවණ්යෙන් පක්ෂීන්ගේ පාද සමාන ලක්ෂණ පිහිටියේනම් ශ්‍රේෂ්ඨ කුලොත්පන්නයෙකු වෙත් නිව ක්‍රියාකිරීම් හා දිළිඳුභාවයද වේ.

---

14. සඳු පුරුෂයන්ගේ මුඛය

යමෙක්තව විශාල මුඛය පිහිටියේ නම් පරහට උපකාර කරණබව වේ. කුඩාවූ හදවි පිහිටියේනම් අසිරිබ්‍යාත ඇති බව හා ප්‍රලාප කියන බවද සවල්ප අවකාශයක්වත් ලැබුණොත් අනුන්ගහු වශකුව වඤ්චාකරගන්නා බවද, ශීලාචාර අයෙකු මේන් පෙන්වන බවද, සම්‍යගක් ප්‍රයෝගයෙහි දක්ෂභාවයද වේ.

මධ්‍යම ප්‍රමාණ මුඛය පිහිටියේ නම් සම්මදන ගතියද, ප්‍රිය වචනයෙහි හා යම් යම් දේ හැන උපයා ගෙදිමෙහි සමත්බවද, නම් අදහස පරිද්දෙන්ම කවයුතු කොට ඉෂ්ටාර්ථ සඵලකර ගන්නාබවද වේ.

15. සත්‍රී පුරුෂයන්ගේ කථා.

යමෙක්හට දෂ්ඨවූ කථා හා උදාහරණ සහිත කණ්සර කථා ඇත්තේවිනම් උඩගුබවද, තම අදහස් කවයුතු ආදිය පසු වෙද්දී ප්‍රශංසාලාභාදීන්වෙන් අනුන්ගේ කවයුතු නොමිළයේ කරදෙන බවද වහා සිපෙන බවද වේ. වැඩි වශයෙන් මහුවි ලොකු මුඛයක් පිහිටන්නේය.

සහාරක්ඛ කථ කරන ආකාර මිහිරි තෙපුල් හා කණ්සර කථා ඇත්තේ තම් යමක් කියන්ට හෝ කරන්ට සිතුනව්ව හල් නොතබා හොඳ හෝ කරක කරණ බවද, ඒකාකාර වචන ඇති බව හා තරමක් ලොකු මුඛයක් ඇති බවද වේ

වපල එරුෂ වචන කිම හා එසේම ක්‍රියාකරන්නේත් විනම් අනුන් ගැන කිසිසේත් නොසලකා තම කවයුතු ගැනම බලාපොරොත්තු වන බවද, සත්පුරුෂ අයෙකු මෙන් පෙන්නා අසත්පුරුෂ ක්‍රියාකරණබවද, උත්ඝාතයෙන් සතුරන් සෑදූ ගන්නාබවද අභිවෘද්ධියෙන් හා සථිරාඛ්‍යාශයන්හෙන් තුරන් බවද, සවල්ප මුඛයක් ඇතිබවද වේ. තුරුස්තා තෙපුල් ඇත්තේවිනම් පාපභෙති ඇලී ගැලී කවයුතු කරණ බවද, මෝඩ අදහස් ඇතිබවද, කටින් දුගඳ වැහෙන බවද වේයයි දතයුතුයි.

---

16. සත්‍රී පුරුෂයන්ගේ කම හඬ.

යමෙක්හට කොවුලන්, කිදුරන්ගේ හඬ සමාන මිහිරිහඬ පිහිටියේනම් ප්‍රඥවත්භාවයද, ධනය හා සැපයද ලැබේ වෘෂභ ධවනිය (ගවයන්ගේ මෙන්) රැලිහඬ පිහිටියේ නම් ඔසුරුබව හා දුක ලැබීමද වේ.

සෝඝ සහිත නවහඬ පිහිටියේනම් පිණෙතිබව හා දිළිඳු බවද වේ. බොල්හඬ හෝ යක්ඛඩි මෙන් නපුරු හඬ පිහිටියේ නම් ගවහත් නිකරු ලීලාවෙන් තම අදහස් ඔදුකරගැණීමෙහි සමත් බවද, කපටි අදහස් ඇතිබව හා නිතුවක්කාර බවද ධනවත් වීමෙහි අධික ආශාවෙන් කවයුතු කරණබවද වේ.

සත්‍රීන්ගේ නවහඬ මෙන් පුරුෂයන්ගේද, පුරුෂයින්ගේ නවහඬ මෙන් සත්‍රීන්ගේද නවහඬ පිහිටීම ඉතාම අනිෂ්ට ලක්ෂණයකි. එවින් දුක් ලබාදීම ආදිය හා අවසාන විනාශ යද වේ.

17. සත්‍රි පුරුෂයන්ගේ නම්මුල්.

යමෙක්හට එල්ලුනු ආකාර නම්මුල් පිහිටියේ නම් අනුන් විසින් පිදිය යුතුවිත බවද, නීතෘණ කල්පනා හා නීත්‍යානුකූල ක්‍රියාකරණයට උත්සාහවත්භාවයද, මිසුරු හතිය ඇතත් යමක් කරන්ට පටන්ගත්කල විරදම නොමහායා කොදින් කරණබවද ඇතිවේයහි දතයුතුයි

මිහින් පිරුණු නම්මුල් පිහිටියේ නම් නම් අදහස් හඵල කරහන්ට බලාපොරොත්තුවීම විසා අනුන් හැන කිසි අත්‍රකම් පාවක් නොකරණබවද, රාගාභිභූතවූ සිතැති බවද, දුර්ජන වූම නමා සත්පුරුෂයෙකු මෙන් ලෝකයාට හඟවන බවද වේ.

මදක් පිරුණු නම්මුල් පිහිටියේනම් තියුණු නුවණ ඇති බවද, දියුණුවන අදහස් ඇතිබවද, ධනවත්භාවයද වේ.

---

18. සත්‍රි පුරුෂයන්ගේ නිකට.

වටවූ නිකට හා කොපු සව වලවැදුනු ආකාරයෙන් පිහිටි සේනම් කරුණාධික හෘදය, යහපත් ගුණදහම්හි ඇලුම්බවද, ප්‍රඥාවන්භාවය හා ඇද නැති අදහස් ඇතිබවද වේ. නිකටවත් පොලවත් අතර සවලපයක් වලවැදී පිහිටියේ නම් සව කී හති ගුණ අධිකවශයෙන් ඇතිවන්නේය.

පොල ලඟ සිට ක්‍රමයෙන් පහලව පැහැලිව නියන්තලයක අග්‍රරූ තියුණුවූ නිකට පිහිටියේනම් මෝඩ අදහස් ඇතිබවද, පිස්සුහතියෙන් කටයුතු කරණ බවද, රළුබවද, වඩකහාවයද, නම්සව අතිම්වූ හරුබුහුමින් ලැබිවට තිප්පුබවද, අනුන්ගේ දෙස් සොයන බවද, අස්ථිරවූ අදහස් ඇතිබවද, සත්පුරුෂ ගුණය රවට අහවා ගුඩ ලාබුණුවිටක ඕනෑම නපුරක් චරන්ට ලැකි සරම් රෞද්‍රභාවයද වේ.

උඩට නෙරුම්වූ උලක් වැනිවූ නිකට පිහිටියේනම් උපා යෙදීමෙහි අතිදක්ෂභාවයද, සියල්ලන්ට ප්‍රිය උපදවන හඩා කිරි මෙහි සමන්විතබවද, කපටි අදහස් ඇතිබවද, නම් අදහසට අනුන් නම්ගැණීමට උත්සාහකරණ බවද, වෙර ක්‍රියා ඇතිබවද වේ.

---

19. සත්‍රි පුරුෂයන්ගේ ශ්‍රවණ සොහොත් කුලෙ.

යමෙක්හට මයුර, සුනඛාදීන්ගේ මෙන් දිස්වූ බෙල්ල පිහිටි ශේනම් ඒකාන්තයෙන්ම දිළිඳුබව වේ.

සැහවුන ඇවැත්කරින් හා මසින් පිරුණ බෙල්ල පිහිටියේ නම් ඉතා වාසභාවසම්පන්නභාවයද, පරම්පරාවෙන් පැවතෙන ගේ දොර හිමිවන බවද, පරහට අනුකම්පක භාවයද, මිහිරි තෙපුල් කියන බව හා දක්ෂ නම්කඩයද වේ.

මදක් මහත්වූද, වවවූද, පිරුණොවූද, ඇට පුරුක් නොපෙණෙන අයුරු බෙල්ල පිහිටියේනම් ඉතා සම්පත් ලැබෙන බවවේ.

ඉතා මහත්වූද, ඉතා කෘශවූද, බොහෝ දික්වූද, බොහෝ නොවවූද රේඛා කිපයක් පේන ආකාර උගුරුදණ්ඩද යන මේ ත්‍රිවිධ ලක්ෂණ පිහිටියේනම් අනිෂ්ටඵලදායක වේ.

දිලිසෙන පියුම්පතකට බඳුවූ ප්‍රියජනකාකාර කුළල පිහිටියේනම් විදෙශගමනය හා ධනපුබ ලාභයෙකි හානව්‍යතාවද වේ.

කලයක් සමාන පුඵටමත් කුළල පිහිටියේ නම් නොයෙක් දුක් ලැබෙන බවද, අසත්පුරුෂගනයි හා ලෝභිභාවයද, අසන්න වුන්ගේ සිත් දූෂ්‍යකරවන රෞද්‍ර වචන කියන බවද, උපකාරකළ අයව පෙරළා අනුපකාර කරණ බවද, ප්‍රයෝගයෙහි සම්ඵල භාව ඇද වේ. මසින් පිරුණ කුළල පිහිටියේ නම් සියල්ල කෙරෙහි කරුණාධිකභාවය වේ. ඔලුවේ (කුණුවලව) පානින් ඇවිපුරුක් පේන ආකාරයෙන් පිහිටියේ නම් ඉතා අභාග්‍යසම්පන්න භාවය වේයයි දතයුතුයි.

20. සත්‍රී පුරුෂයන්ගේ මුහුන.

යමෙක්හට රළුවූ, දෘඪ පරුෂවූ මුහුන පිහිටියේ නම් ක්‍රූර ගතියද, මෝඩගතියද, යම් යම් විටක තම අදහස් සිදුනරගන්න අවියෙන් මෘදු සවභාවය පෙන්නා ක්‍රියාකරණ බවද වේ.

රත්තවණ්වූ පිරුණු වට මුහුන පිහිටියේ නම් ගඟපත් බවද, විසඟස නවයුතු බවද, සබහ්‍යභාවයද, නීතර හෙල්ලම් සහිත බවද, යහපත් සිනි නුවණ ඇතිබවද, සත්පුරුෂගාමියද වන්නේ යයි දතයුතුයි.

සිලුවුවූ සිහින් හොඳ සඩවසමේ මුහුන පිහිටියේ නම් කඩි සර බවද, තියුණු නුවණ ඇති බවද, අනුන් හැන මදක් සැක සහිත බවද, මිහිරි කථා කියනබව හා සිගල්ලන්ම අවඩකාදර යෙන් නවයුතු කරණ බවද වේ

මුහුන හොඳවුවි හොඳ වල වැදී හකුඇටේ පේනයේ පිහි වියේ නම් සියළු කවයුතු හරණ අවසථාවල සුපරීක්ෂා වෙන් කරණ බව වේ. ඒ මුහුනේ දොම්හස් සහිත බවක් පෙනේ.

සුදුමැලි මුහුන පිහිටියේ නම් මාංශ හක්ෂණයෙහි ආශා ඇති බවද හය සහිත බවද වේ

අනෙක වණ්යෙන් රක්තවණ්වූ මුහුන පිහිටියේ නම් දුම්ල හාවයද, ඔහි නුවණ අඩුබවද, ශරීර ශක්තිය හීනභාවයද, රෝග පීඩාවලට හවහස්වන බවද වේ

පැල්ලම් සහිත මුහුන පිහිටියේ නම් සියළු අයුරින් නපුරු කවයුතුවලට ඇළුම් ඇති බවද, තම කවයුතු කිසිවෙකුට නොකෑ හෙන අයුරින් කිරීමෙහි ඉතා හමත් බවද වෙයයි දහයුතුයි.

සත්‍රී පුරුෂයන්ගේ බෙල්ලෙන් උඩ පිහිටි දෙහලක්ෂණාධ්‍යාය නම්වූ පළමුවෙනි කාණ්ඩය මෙතෙකින් නිමවනලදී.

සත්‍රීන්ගේ ශරීර ලක්ෂණ

අධ්‍යාය නම්වූ

දෙවෙනි කාණ්ඩය

දෙහලක්ෂණ විද්‍යායාම් පූර්හාන ප්‍රදර්ශිකාන්
අතඃ සත්‍රීණාම්ව සර්ෂාඩග ලක්ෂණං ලක්ෂතෙමයඃ.

සත්‍රීන්ගේ ශරීර ලක්ෂණාධ්‍යායෙහි පද්මිනීය, චිත්‍රිණීය, සංඛිනීය, හස්තිනීය යන ප්‍රභෙද හතරක්ද; උත්තම, මධ්‍යම, අධම යන ත්‍රිවිධාකාරයක්ද ඔවුන්ගේ ලක්ෂණ, සවභාවයන්, ගුනාඩග යනාදී කරුණු රාශියක් මෙම අධ්‍යායෙහි පිළිවෙලින් ප්‍රකාශ කරණු ලැබේ. එනම්:—

පද්මිනී වකාහි දික්වූ කෙස්වැටියද, නීල වණ්යෙන් හෝ මුවන්ගේ වැනි නේත්‍ර යුග්මයද, කුඩා කැයය සහ පෙරට නැමුණ උරහිස් පිහිටීමද, ප්‍රීතිජනක රූප වචන හා අනුකම්පා සහගත ප්‍රකෘතියක උපතින් හෙළුල් කිමිදි, අවංක හැසිරීම හා කුළුණු ගුණයෙන් අනුන්ගේ කවයුතු ඉටුකර

දීමද, ලක්ෂණවූ කීර්තියත් සුවද පිහිදෙනාක්මෙන් කෙළින් පිහිටි ශරීරය සහ නිතර බොහෝ මිරිහිදු ආභරණයෙන් හැරසීමද, අළු පෙන් පුපුදුවූ මලක්මයේ ලක්ෂණවත් මිනුහද, ප්‍රාණයාගේ කුලදම් රැකීමද, හොඳහොක් පතිව්‍රතා රක්ෂාකිරීමද, ප්‍රසිවීමද යන මේ ගුණ හා ලක්ෂණ ඇති සත්‍රී පද්මිනී නම් වේ මෙම පත්‍රී වර්ගය කරණ ස්ථානයට කිරි තෙල් උතුරන්නාක්මෙන් සියළු සම්පත් ඇතිවීම හා විෂ්ණුගේ ආධාරය ඇත්තේත මොවුන් ලැබීම පෙර පින්කල පුරුෂයින්මවා පමණකුත් නොව එම පුරුෂයන් මෙලොව වශයෙන් දිව්‍යසාපමෙන් අනේක සම්පත් ඇතිවන්නේ යයි දතයුතු.

චිත්‍රිණී වන කී සුනිලවණී දෙනුවන් හා පියුමක් මෙන් සිහිවි නාසයද, දුටුවන් ප්‍රියකරණාකාරයෙන් ඉඳීම පිහිටීමද වඩා උසනොවූ ඉතා මිරි කැකිවූ මවිකුරු අවයවයන් හා දුටුවන් පිනවනාකාරයෙන් පිහිටි සවුම්‍ය වූ ලක්ෂණවත් ශරීරයද, දුටු දුටුවන් විසින් ප්‍රේමය කරණ ගතියද, ඇට යහළු සත්‍රීන් බොහෝ ඇතිවීමද, සැප ලැබීමෙහි ආසා ඇතිවීමද, අනාචාර කෘත්‍යරූම් නොමැතිවීමද, හේ දෙර වැවකර වීමට සතුටු ගතියද, සියළුදෙනාට කරුණාවන්තවීමද, තම සවාමියා කල කිවූ පමණකින් සතුටුවීම සහ චරදට මවෙක්මෙන් සමාවීමද, අන්‍ය පුරුෂයන්ට ආලය නොබඳින ගතියක්ද, මිහිරි තෙපුල් කීමෙහි කිනීමෙහි ආසා ඇතිවීම සහ නිතර දෙවි බඹුන් පිදීමද යන මේ ලක්ෂණ ඇති සත්‍රී පද්මිනී නම් සත්‍රී හා සමානව සවාම්පුරුෂයාට සම්පත් ලබා දෙන්නීයැයි දතයුතු

සංඛිණී වනාහි නීලවර්ණයට සමවූ ඇස් පිහිටීමද, කරවට ඉරි තුනක් හෝ රැලි තුනක් පිහිටීමද, ලැමද විශාල වීමද, ශරීරය බොහෝ උස්වීමද, ඇතෙක් අළුගද නික්මීමද, යහපත් චාරිත්‍ර ධර්මයන් නොදැනීමද, ඇසුවන් ප්‍රිය කරණාකාර මිහිරි බස් නිම සහ කවට වචන කීමද, දිවා රෑ දෙක්හී සුඛාව නොබලා නිෂ්ඵල භාර්යාකීම සහ මායා සිතා පහල කිරීමද, ලක්ෂණ පුරුෂයන් දුටු තෙණෙකීම මදකිපී විකල සිතිඅතිවීමද, සවලාගක්වත් ඉඩ ලැබුනි නම් එවුන් හා සමග හාම සම්පතනියෙකි සෙදීමද, ඊර්ෂ්‍යා මාත්සර්‍යාදිය නොඇතිගෑ තම පුරුෂ

යාවි රහසේ සොර පුරුෂයන් සේවනය කිරීමද, මොරු බස් කීමද, රති ක්‍රීඩාවෙහි ලොල්වීම හා ඊට දක්ෂගනියද යන මේ ලක්ෂණ ඇති සත්‍රී පාවාගත් පුරුෂයාහට අනේක දෝෂයන් හා හොයෙක් විපතයි සිදුවන්නේ යැයි දතයුතු

හස්තිනී වතාහි හිතකොස් අඹුවීම ද, රතනවණ් දෙ ඇස් පිහිටීමද, ලොකුවූ කන්කැපුව සහ සනවූ දෙතොලද, මද සිප්‍රනාසාකාර ලස්සන විශාල දෙතනද, ලෙලදෙනා කාරයෙන් පිහිටි ලොකුවූ පිඩුමසද, රක්තවණ්යෙන් මිටිවූ මහත් වූ ශරීරය ද, ඇතෙන් පල්ගද මිහිදීමද, තම පුරුෂයාට ප්‍රිය නොවීම සහ අකටයුතු ක්‍රියා කිරීමද, නිතරම සිතේ සැක හින්නක් ඇතිවීමද, සල්ලාලයන්ට ආලය ඇතිවීම සහ තම පුරුෂයාගේ බසට නොකැමීමද, පාපක්‍රියාවන්හි ඇලීමද, අධම කල්ක්‍රියා ඇති වීම සහ කාමසම්පත්තියෙහි ඇලීමද නොහොත් කාමාසාව මිස වෙන කිසිත් උවමනා නොකරණ ගතියද, නම්බුකාරියක් මෙන් හඟවමින් ඉතා සල්ලාලගති සිරින් ඇතිවීමද යන මේ ලකුණු හා ලක්ෂණයන්ගෙන් යුක්තවූ සත්‍රී නොමෝ සඟකීය පුරුෂයාහට හැති රියෙක් වන්නියයි දතයුතු.

තවද උත්තම ශරීර ලක්ෂණ හා යහපත් ගති ක්‍රියා ඇති සත්‍රීන් පාවාගැනීමෙන් අල්පායුෂ ඇති පුරුෂයා නමුත් දීර්ඝායු කෘ සැප ලබන්නේ වේ. එසේම නපුරු ශරීර ලක්ෂණ හා අධම ගති සිරිත් ඇති සත්‍රීන් පාවා ගැන්මෙන් දීර්ඝායු ඇති පුරුෂයා නමුත් අල්පායුසින් ඔහුගේ මරණය පැමිණෙන්නේ යැයි පුරාතන ඍෂීන් විසින් ප්‍රකාශකර තිබේ.

එබැවින් සත්‍රීන්ගේ ශරීර ලක්ෂණ අදුනාගැනීම කිරාමිමයේ ඕනෑයන පුරුෂයන්ගේ ප්‍රාණාරක්ෂාවක් බැව් හලකා යමෙක් මේය ශ්‍රවණය කරන්නේ නම් ඔහුගේ මතු ජීවිතය අයිතයින්ම වාසනාවන්ත වේයයි නිසැකව කිවහැකිවේ.

එහෙයින් ප්‍රථම කාණ්ඩයෙහි අවසාන පිරිවෙහි දක්වූ අඩක පිළිවෙලින් සත්‍රීන්ගේ හිස සිට දෙපතුල දක්වා පිහිටි ශරීර ලක්ෂණ හා ඊට නියම ගුණාගුණ ආදී ගති සිරිත් රාශියක් මෙතැන් සිට කියවනු ලැබේ.

නො. 2 සිතියම.

පද්මිණී.

(14 පිට හා සම්බන්ධයි.)

මෙහි චිත්‍රය 14 වෙනි පිටෙන් බලා ගතයුතුයි.

නො. 3 සිතියම.

චිත්ත්‍රිණී.

(15 පිට හා සම්බන්ධයි.)

මෙහි චිත්‍රය 15 වෙනි පිටෙන් බලාගත යුතුයි.

නො. 4 සිතියම.

සංඛිණි.

(15 වෙනි පිට හා සම්බන්ධයි.)

මෙහි විසතර 15 වෙනි පිටෙන් බලාගත යුතුයි.

නො. 5 සිතියම.

හසතිණි.

(16 වෙනි පිට හා සම්බන්ධයි.)

මෙහි විසතර 16 වෙනි පිටෙන් බලාගත යුතුයි.

1. සඟුන්ගේ හිස

ඔම් සත්‍රියක්ෂරම හිස්මුදුන මැදක් උස්ව පිහිටියේ නම් යහ පත්වූ පුණ්‍යවන්තියක් වේ. ලොකුවූ හිස පිහිටියේනම් නිර්දෝෂ ගතිය සහ යහපත් හිතුවකින් සුස්තව ක්‍රියා කරන්නියක් වේ. කුඩාවූ හිස පිහිටියේනම් නිහඬ භූත බුද්ධීන් ඇතිවීමද, හෙල්ලම් ගතියද ඔම් යම් දේ කොදුකාර වැටීමද, අත්පුරුෂ හානියද ඇත්තේවේ. හිසේ දෙතෙල වර වලවැදුනාකාර නොකොත් එබුනාක් මෙන් පිහිටියේනම් බොහෝ යහපත් හිතුවණ ඇතිවීම හා ඉගෙනීමෙහි සම්වගති ඇති කරයි. පසුට පැනනියාකාර හිස ඇත්නී මිනිසේ ගුණදම් රැකීමද, ඔම් යම් දේ හැන නොරවටෙන ගතිය හා පහසුවෙන් ඔමක් විශ්වාස නොකරණ සිරිතක්ද, අඵප්‍රයෝග ගතියද, ඇති කරයි හිසේ ඉන්නෙක් හෝ තල කැලලක් පිහිටියේ නම් සීලාදි ගුණදම් ආදියෙන් තොරව ලෞකික සම්පත්තියෙහි ලොල්වූ තැනැත්තියක් වන්නේයයි දත යුතු.

නො. 8. සිතියම.

2. ගිඹෙහෙස්.

ඔම් සත්‍රියක්ෂරම නොවවූ හිඹහෙස් පිහිටියේ නම් සමීපත් හිනවෙ. තුනීවූද සැහැල්ලුවූද මිකුරින් වණ්ණයෙන් රළුවූ හිඹහෙස් ඇත්නී වදවීමද, වැහැඹුවීමද, ධනහීනවීමද, දුක් ලැබීමද වේ. පිපුනාකාරයෙන් රැලි සහිත හිඹහෙස් ඇත්නී සදිසි ලාභ සහ පෑඑවිලාභ ලැබීමෙහි වාසනාවන්ත වේ. ඉදිරිපස බෙහුවුව හෝ මී වණ්ණයෙන් වකුටුවූ අග් ඇති හිඹහෙස් ඇත්නී පුණ්‍යවන්තවීම හා යහපත්වේ. බඹරුවණ් හිඹහෙස් පිහිටියේ

නම් සැපලෑමේනි වාසනාවන්තවේ. පිරුණු සෙස්වැටිය ඇත්නි මාන්නය පහකිරීම හා නින්දිත පුරුෂ සේවනයද, සවාමියාව හැරහුම් කිරීමද කරන්නී වේ. කිසිවූ ගිහකෙස් නොකොස් අවු කිසකෙස් ඇත්නී රළු ඔප් ඇත්ගියක් වේ. ඉතා දික්වූ කිහකෙස් පිහිටියේ නම් ධන ලැබීම සහ සැපසැසීම කරයි. බොහෝ කළු වණ දික්වූ ගිළුටු කිහකෙස් පිහිටියේ නම් ගියළු ආහාවන්ති අධිකයට නොපැමිණ පරිභෝගකාරීව ක්‍රියාකරන්නී වේයි. ඇවි කෑමතෘෂ්ණාව අධිකව කෙරුවතිකා නමුත් තම සවාමියාට ඇල් මෙන්ද ප්‍රිතිසහගත ක්‍රියාකිරීමෙන්ද කල්යවයි. ඇ මිදුම් ගරිරයක් ඇත්තියක් වේ.

දික්වූ දුඹුරුවර්ණ ගිළුටු කිහකේ පිහිටියේනම් සියළු කවියුත් තෙතිම යහපත්සේ ක්‍රියාකිරීමවිද, අවංක ගතියද ඇත්නී වේ. ඔනොමෝ ගරිර සැප ඇති බොහෝ දරුවන්ගේ මවක්ව වාසනා වනත ජීවිතයක් ගතකරන්නියක් වේ. මදක් දුඹුරුවණ් දිගසිළුටු ඉසකේ පිහිටියේනම් මෘදුසිත් ඇතිවීම සහ සෘණයකින් කිපෙන ගතියද, උඩඟුගතියෙන් ක්‍රියාකිරීමක් නැති නමුත් අධිකලෙස රාගඇල්මද, නිරෝගිභාවය ඇති වඩා වාසනාවන්තියෙක්ද නොවන්නෝ වේ. එළලුවණ් කිසකෙස් පිහිටියේනම් රාගාධිකවීමද, සථිර අදහස් ඇතිවීමද, තමන්ගේ රූපශෝභාව ගැන ප්‍රශංසා ලැබීමෙහි ඉතා කැමැතිවීමද, සෙල්ලම් සහ කඩිසර ක්‍රියාවන්හි ක්‍රමයෙන් එහෙකව වඩා අනිකට ප්‍රියවීමද, දිර්ඝායු ලැබීමද වේ. රක්තාභණයෙන් දිර්ඝවූ කිසකෙස් පිහිටියේනම් වාචාලවූද, නිරුනිඨ ඉක්මින් කවියුතු අදහස් කරන්නාවූද, රළුගතිය ඇති රාගාධිකවූ ශක්තිමත් ගරිරයක්ද ඇතිවේ. ඇ මොහෝ කාලයක් නොපවතිනා බවද ඇඟේ පොරොන්දු විශ්වාස නැතිබවද යමෙක් දුටුවිට පළමු කවියුතු මොකුත් මතකනැති සුභාවයෙන්ද, කිත නොගෙක් අතේ පෙරළෙන අතුමේ වැටල අදහස් හා ඉහළකි ගති සිරිත් ඇත්නියක්ද වේ. බිඹුරුවණ් කිසකෙස් පිහි වා අග මිදු මෙන් කැරකුනේ නම් වෙසෙසින්ම යහපත් කුණ විනතියෙක් වීමද වේ. සැවිවණ් කිසකෙස් පිහිටියේ නම් විශ්වා සය කඩවීමද, දුඹුරුවණ් වීනම් දැඩියක්වීමද, එල්බෙනාකාර කෙස්වැටිය පුහිටියේ නම් කුලය නැසීමද, කිසකෙස්වලින් ලොම් සුලිමෙන් පිහිටියේ නම් වැහැළුවීමද වන්නේයයි දතයුතු.

8. කිසකෙස් වැටීම.

යම් සත්ත්වයෙකුගේ ඉසෙහි ඇත්තේ කිසකෙස් වැටෙනවා ආ පහසුවෙන් යම් යම් දේ ගැන රැවටීම හා කණගැසීමෙන් මෝදවේ.

ඔලුවේ පිරිපහ කිසසෙස් වැටෙනම් මූර්ඛ්‍යා ගතියද නිතරම කිපුනාවූ සුභාවද උදුරතරගතියෙන් විපත් සිදුකරගැනීමද, ප්‍රලාප කීමේද ඇත්තීවේ. නමුත් ඔතොමෝ උත්තානවියැයියෙන් වස් තුන් ඉපදවීමද වික්‍රම දේවල් කිරීමෙකි සහ දැකීමකි ඉතා වියදම් කිරීමද, එහිත් අගිවෘධියට පැමිණීමද, නමුත් අවාසනාවන්‍යතාව යට නොපැමිණෙන්නේයයි දතයුතු.

4. කොණ්ඩඤ.

යම් සත්‍රියෙක්හට බඹුරුවණ්යෙන් අඹින් නැඹුන සිඳවූ කිස නෙස්වලින් යුක්තවූ වඩා ලොකු නොවූද, ඉතා කුඩා නොවූද, නොනෙත් තරමින කොණ්ඩඤ පිහිටියේ නම් ඇ ඉතා පුණ්‍යවන්තියෙකි. ඇත්සොඬයක්මෙන් හෝ බත්ම ඵලයක් හා සමාන ගතියෙන් උස්වූ කොණ්ඩඤ ඇත්නී ධන සැප ලැබීමෙහි වාසනාවන්තවීමද, ධර්මිෂ්ඨවූ පුණ්‍යවන්තියෙකි. ඉතා ලොකුවූ කොණ්ඩඤ ඇත්නී ඊශ්වර්‍යවන්ත ආදිය නොසොයා රාගාධික්‍යම හේතුවෙන් අධම පුරුෂයන් කරා සල්ලාල ක්‍රියාවන්නී ඇළුම් ඇත්තියෙකි. දිර්ඝනිඝණෙස් හා කුඩානොණ්ඩඤඇත්නී සවකීයපුරුෂයා අත්හැර පරපුරුෂයන් සමඟ වාසය කරන්නියෙක්ද වේ. සත්‍රින්ගේ කොන් ඔස බොහෝ ලොකුවීම හා ඉතා කුඩාවීම අවලක්ඛණවා පමණකුත් නොව අයහපත් නොනෙක්වේ. මධ්‍යමාකාරයෙන් කොණ්ඩඤ ඇත්නී යහපත් සත්‍රියක් වන්නේයයි දතයුතු.

5. නළල.

යම් සත්‍රියක්හට උස්වූ නළල පිහිටියේ නම් සම්පත් ලැබීමේහි වාසනාවන්තා වේ. දික්ව පිහිටියේනම් හිමියාගෙන් වෙන්වීමද, නැතහොත් සවකීය පුරුෂයා මියයාමද, සවාමියාගේ කුඩා හොඳොයුරන්ව අපල සිදුවේ. අඳුසදන ආකාරයෙන් උස්ව තුන පුලක් පමණ පළල්වූ නළල පිහිටියේනම් ධන සැප ලැබී මහා වාසනාවන්තවේ. නළලේ දෙඅතෙළවර හැට සහිතව පිහිටියේනම් වංක අදහස් ඇතිවීමද, නළලමැද උස්ව ඉදිරියට නෙරා පිහිටියේ නම් යම් යම් දේ ගැන දැඩිගතිය හා ලෝභගතියද, නළලේ ඉන ලින් හා පහලින් මස්කඳු දෙකක් මෙන් උස්ව ඒමැද ඇතැලියක් සේ පහත්ව නොනොත් ගැඹුරුව පිහිටියේ නම් කම්නාතගන්නී දැඩිවීමද, මෙහෙ දෙයක් නමුත් ඉතා සැලකීමක් ඇතුව එය ඉවෙතරන්නේය. නෙතෙකුගේ වචනයට දෙන උත්තරය පළමු

වචනයට පහරක් මෙන් රළුවූ දෘෂ්ඨකථාකාරියෙකි. ඇ සියළු කරු යුතු ගැනම උන්හෘභවනතා ක්‍රියාකිරීම ඇරත් ප්‍රශංසා හා පූජා ජන ලබන අදහසින් නවයුතු කම්පනාදියෙහි හෙදී ක්‍රියාකර තම අදහස් සඵලකර ගන්නේගයි දතයුතුයි.

6. නළලේ ලකුණු.

යම් සත්‍රියක්හට නළලේ බොහෝ රේඛා ඇතුව හෝ ඇතැ කුසේ කුහිසඨලයක් හා සමාන පිරුහාකාරයෙන් සවිලපරෝමු සහිත නළල පිහිටියේ නම් අයිශයින්ම ඉතා රාගාධිකවීම් ද සවල්පයක්මත් ඉඩ ලැබුනවිට සල්ලාල ක්‍රියා කිරීමදවේ. ලොම් සහිත නළල පිහිටියේනම් අනේක දුක් ලැබීමද රෝග ඇතිවීම හා දුඃඛමිද කරයි. ලොම්සුලියක් පිහිටියේනම් වදවීම හා වැඳුණු මේ. සවසයිකයක් හෝ සංඛයක් හා සමාන ලකුණක් නළලේ දක්නා ලැබේ නම් ඛන සැප ලැබීමෙහි වාසනාවන්තවීමද, පුණ්‍ය වන්තවීම හා භෝගසම්පත් ලැබීමද වේ. ත්‍රිසූලයක් එනම් උර් තුනක් හා සමාන ලකුණක් නළලේ දක්නාලැබේනම් සේනාපති ඨානාන්තර ලන් අග හා සමග හෝ සමාන සෙතෙකුගේ හායු වක්ව උතුම් කුණ්ඩලියෙන් හැසිරෙන තෙනෙක් වේ. කඩුවක් සමාන ලකුණක් පිහිටියේනම් යම් යම් දේ ගැන සුරක්ෂිත බව් ක්‍රියා ඇතිවීම හා යහපත් ප්‍රඥාබුද්ධීන් ඇත්තාවූද, සැමදෙනාට ප්‍රියකිලි කුණයෙන් කල්යැවීමද වේ. එම සත්‍රින්ට වාසනාවන්ත සහිත ශක්තිමත් ශරීරයක් ඇතිවීමද, දිඝායු හා සැප ලැබීමද වේ. සත්‍රින්ගේ නළල්තලයේ දකුණු පස හෝ වම්අංසේ මාසක ලකු ණක් එනම් ඉන්නෙක් පිහිටියේනම් ඉතා වාසනාවන්තියක්ව කල් යවන්නේගයි දතයුතු, නළලේ දකුණු පස ඉන්නෙක් හෝ තල කැලලක් පිහිටියේනම් කීර්තියෙන් නිමිල බලැති පුතෙක් ලැබීමද, යහපත් කරුණාගුණවන්තවීමද, දෛඝ්‍යායුෂ්මත්භාවයද, වාසනා වන්ත යහපත් පුරුෂයෙක් ලැබීමද වේ. නළලේ වම්පැත්තෙන් එසේම පිහිටියේ නම් මැලිගතියද, රෝගයෙන් හරිනවීමද, මින් පැන් ප්‍රියවීමද වන්නේගයි දතයුතු.

7. ඇස් බැම.

යම් සත්‍රියක්හට වවවූ හෝ මෝලොක්වූ හෝ ඇඳුම් හොඳ කෙත් දුනුඇතාකාර හෝ සුනීලවණ් මෘදු ලොම්වලින් යුත් ඇස් බැම පිහිටියේනම් කාමිසම්පත් හා වස්තු සම්පත් ලැබීමද, රාගා

ඛක විමද, ලෝහයින් ඇත්තේද වේ. සිහිදු ලොම් ඇතිව වඩ ලොකුකොටවූද ඉතා මහන්කොටවූද නොකෙහෙත් මධ්‍යමාකාර දුටු වන් ප්‍රියවන්නා වූ සෞම්‍ය වූ ඇඟිමැම ඇත්නී වාසනා ගුණදම් රකින්නියෙක් වේ. බොහෝ මහත්ව හෝ ඉදිරියට නෙරා හෝ ඇද නොමැතිව හෝ දිස් ලොම් ඇතිව හෝ පිහුවන්ව හෝ ලොම් අඩිකලෙස ඇතුව හෝ ලොම් නැතුව හෝ එකිනෙකට හාවී හෝ මෙයින් යම්කිසි ආකාරයක ඇස්බැම ඇත්නී හුණධර්මයන්ගෙන් තොරවේ දකුණු ඇඟිබැමේ ඉන්නෙක් හෝ තලකැලලක් පිහිටියේ නම් රතික්‍රීඩාවෙහි දක්ෂගතියද, ධන හා සැපලාබී මද, ඉතා යහපත් පුරුෂයෙක් ලැබීමද සම්පත් ලැබීමද, දියණියක් සුවපත්ව විසීමද වේ. වම් ඇඟිබැමේ නම් රාගයෙන් මත්වීමද මත්පැන් පානයකිරීමෙහි ආසාවද, ඉතා මැලිසින් ඇතිවීමද වේ ආ රළු අදහස් ඇති දුක්ලබන්නියෙකි. ඇඟිබැම් දෙක අතර ඉන්නෙක් හෝ තලකැලලක් පහිටියේනම් ආ වාසනාවනත දරු මුනුබුරන් ලැබීමද ඇඟේ සැප වර්ධනයවීමද ධන සැප ලැබීමද පුණ්‍යවනත කුලාඛ්‍යතාවක් වන්නේයයි දතයුතු.

8. ඇඟිපිඹ.

යම් ස්ත්‍රියක්හට මුදුවන ආකාර වටවූ ඇඟිපිඹ පිහිටියේ නම් රූකාන්තිවීම් හා ධන සැප ඇත්තේ වේ. කළුපාටවූ මොළොක්වූ සනවූ ඇඟිපිඹ හෝ සනවූ කළුවන් ඇඟිපිඹ පිහිටියේ නම් නම් සවාමියාට යස ඇසෙවෙයි ලබාදෙන වාසනාගුණවතියෙකි. තුනී වූ කළිලවණ් මහත්වූ ඇඟිපිඹ ඇත්නී දුශ්චරිතයන්හි ඇලී හැසිරෙන්නා තරයි. නොකෙහෙත් වෛශ්‍යා ස්ත්‍රියෙකි. දික්ව හෝ කොට වූ කළිලවණ් ඇඟිපිඹ ඇත්නී අන්හට හෝහ දුක් ඇත්තියෙකි. සිහුම්වූ තුනී ඇඟිපිඹ පිහිටියේ නම් සිතළු කටයුතු හැනම සෑහෙන දෙනා ගතියෙන් ක්‍රියාකිරීමද අනුන්ට නොකියන්නාක් මෙන් උත්සාහ පෙරදැරිව නම් කළයුතු සම්පූර්ණ කරගැනීමද ඒකාග්‍ර මිත්තාධිකාරීවීමද ඇතිවන්නේයයි දතයුතු.

9. ඇස්.

යම් ස්ත්‍රියක්හට වටවූ ඇස් පිහිටියේනම් කුලඟට උසස් අග හා සමඟ යන්නේ වේ. නොකෙහෙත් නම් මුළුබිලිඳ පුරුෂයා අතවදී ක්‍රියාකරණ කරුණාවනතියෙකි. දික්වූ ඇස් පිහිටියේනම් සෞම්‍ය ගුණ හා යහපත්වූ උතුම් ගුණවතියක්වේ. එළුවන් මෙවියන්ගේ සමාන මැදින් උස්වූ නෙරා පිහිටි ඇස් ඇත්නී අවා

සහාවනීයෙක්වේ. උස්වූ ඇස් පිඹිවියේනම් අල්පාපු ආත්මීයෙක් වේ. කැකුළුකාකාර ඇස් ඇත්නී ස්නෙහවතියක්වේ රතුවණ ඇස් පිඹිවියේ නම් රෞද්‍රශක්තිසිරින් ඇතිවීම හා ඇගේ සවාමිපුරුෂයා මියයන්නේවේ. පිඟුවන්වණ ඇස් ඇත්නී ධනඇප ඇත්තියක් වේ. ඇස්කොන් රතුව සුදුමණ්ඩලයේ කළුවණ තාරකාවෙන් පැල්ලම් පිඹිවියේනම් යහපත් ගතිගුණ ඇත්තියක් වේ එළුවන්ගේ වැනි ඇස් ඇත්නී මූලාශ්‍රිත් ඇත්තියක් වේ. පක්ෂීන්ගේ වැනි කුඩා ඇස් පිඹිවියේ නම් නපුරු ගති ක්‍රියා ඇත්තියක් වේ මියන්ගේ හෝ කොබෙරියන්ගේ සමාන ඇස් පිඹිවියේනම් නපුරු ගති හා කාමුකයි අඩුවේ. කිළුකාකාර ඇස්පිඹිටියාහු නම් දිවාරාත්‍රියෙක් නි රාගයෙන් මත්වූ නපුරු ස්ත්‍රියක් වේ. ඇතුන්ගේ හෝ බළලුන්ගේ ඇස් සමාන පිඹිවියේනම් රාගාධික්‍යමද, කුලඝාතියිමද කරයි. පරවියන්ගේ සමාන ඇස් ළඟිවියේ නම් අවසන්ක්‍රියාවන්ගි ඉතා ප්‍රසිද්ධවේ. එලදෙනුන්ගේ සමාන කසාවණ ඇස් පිඹිවියේ නම් උඹතුඹිත් ඇති අසත්පුරුෂ තැනැත්තියක් වේ. නවකාකාර ඇස් ඇත්නී බලවත්වූ හොර ස්ත්‍රියෙකි. ඈ රහසේ සල්ලාලකම් කරණ සඳප්‍රයෝග මායාකාර ස්ත්‍රියක්වේ. ලොකු ඇස් පිඹිවියේ නම් සාමාන්‍යයෙන්ම පින් ඇත්තියක් වේ. තොඇකිලෙන්නාක් මෙන් ඇස්ඇත්නි යහපත්වේ. මිගවයන්ගේ වණ්හෝ පිඟුවන්වණ ඇස් පිඹිවියේනම් දූ දරුන්ගෙන් ඉතා සැප ලැබීම හා බොහෝ ආයු ඇතිවේ. දකුණු ඇස වපරවීනම් වදවේ. වම් ඇස වපරවී නම් පරපුරුම සේවනයද නපුරු කල්ක්‍රියාද ඇතිවේ. දෙඇසම වපරවීනම් මසුරුගති ඇතිවේ. නමුත් ගනුදෙනුවලදී හරියාකාර බේරුම් කරණ සිරිතක් ඇතිවේ. සුනඛයන්ගේ හා සමාන ඇස් පිඹිටි වපර උනිනම් අවසන්ක්‍රියාවන්හි ඇලිගැලි වාසය කරන්නියක් වෙයයි දතයුතු.

10 නාසය

යම් ස්ත්‍රියක්හට මහත්වූ නාසය පිඹිවියේනම් ධන සැප ඇති වාසනාවනියක් වේ. නාසය අග මහක්ව මැදින් නැමී පිඹිවියේ නම් බොහෝ දුක්ඇතිවේ. කුඩානාසය පිඹිවියේනම් පුණ්‍යවන්ත වේ. අග පෙතලිවිනම් දුඹියක්වේ. නාසයමැද බිඳුනේ නම් කාලකණ්ණියක්වේ. දික්වූ නාසය පිඹිවියේනම් උතුරාහරකල්ක්‍රියා ඇති වේ. ඇත්සොඬයක්මෙන් හොඳට එල්බෙන්නාක්මෙන් පිඹිවි නාසය ඇත්නී සණ්ඩුදඹරයන්ගි ප්‍රියකතියද නිරන්තරයෙන්ම කෝප සිත් හා පව්වූගති ඇත්තියක් වේ. නාසේ අග මහත්ව

රතුවී හෝ වකුටුවී පිහිටියේනම් සවාමියා තැති කිරීමේ ලක්ෂණ යකි කොහොත් වැහැබුවේ. මෝලොක්වූ නාසය හා කළුසුදු පැල්ලම් පිහිටියේ නම් සම්පත් හිහවේ. සමවූ නාසය හා කුඩාවූ නාසපුට පිහිටියේ නම් ශ්‍රියාවහනවීම සහ ශබ්දත් ගති සිරිත් ඇත්තේ වේ. නාසාපුටය එනම් ශ්වේදිරා විශාලව පිහිටි නාසය ඇත්තී දුශ්චරිත හැසිරුම් ඇත්තියක් වේ. නාසයේ අග රතු වණ් ඉන්නෙක් පිහිටියේ නම් ධනවත්ත වේ. නිතර නොටු ගලන නාර නාසය ඇත්තී නාලකන්ණියක් වේ. එසේම කළුවර්ණ ඉන්නෙක් පිහිටියේනම් සවාමියාට මරණය අවකල්‍රියා ඇතිවීමද නොහොත් සල්ලාල පුරුෂයන් සොයන්නියක්ද වන්නේයයි දතයුතු නාසය අග හෙළිපලයක්සේ රතුවර්ණ ඉන්නෙක් පිහිටියේ නම් දිළිඳුකොංවන වස්තුකාරියක් වේ. කළුවර්ණ තල කැලලක් පිහිටියේනම් මත්පැන් බීමෙහි මදක් ඇල්මද දෙගෙදෙණන්තරවල යාමද අසඹ දේවල් සෙවීමද නොකිපෙන එඩිදැඩි වංක නොවූ ගතිය සහ සෙල්ලම් ගතියක්ද ඇතිවන්නේයයි දතයුතු.

11. කන්.

යම් සත්‍රියක්හට විශාල කන් පිහිටියේ නම් වාසනාවන්ත දුදරුවන් ලැබීම හා ධනසැප ඇත්තේ වේ. කන් ලොකුව දෙතුන් පලකින් බිදුනාක් මෙන් පිහිටා ඇත්නී වංකහකීය හා චපල ගති සිරිත් ඇත්නී වේ. නහර වැඩුනාවූ හෝ වැහැරුණ කන් පිහිටියේ නම් අධම ගති සිරිත් හා අවාසනාවන්ත වේ. කුඩාවූ කන් පිහිටියේ නම් පුරුෂත්වය ක්‍රියාකිරීමද, කොරි කන් පිහිටියේ නම් ඇසුදුවුදෙය නොහොම නමුත් අනුන් සමග කියන්නේය. නොහොත් කේලම් කීමද, අනුන්ගෙන් අපවාද නිතු හැරහුම් වචන අසන්නේ වේ. දික්වූද, පටුවූද, සිහින්වූද, කන් පිහිටියේ නම් ධනසැප ලැබීමද, ප්‍රදෙවන්තවීමද, පරෝපකාරිවූ සත්පුරුෂ ගති යෙන් ක්‍රියා කරන්නියක්ද වේ. ඇ කිහිකලනවත් ඇසූ දුටු දෙයක් අනුන් සමග නොකියනාකාරයෙන් තම සිතෙහි තබා ඔවුනොවුන්ගේ අදහස් දැන කල් යවන්නේය. එල්බෙනාකාරයෙන් නොහොත් තොළු කන් හෝ වවටු කන් පිහිටියේ නම් හොඟසම්පත් ලැබීම හා යශපත් ගති ඇතිවීමද වේ, රෝඹු සහිත කන් ඇත්නී දරිද්‍රවීම හා වැහැබුවේ. මේ ආදි වශයෙන් මෙතෙම ආකාරයෙන් නමුත් කන් පිහිටා ඉන්නෙක් හෝ (මිනිසෙක්) ලකුණක් පිහිටියේ නම් ඇතේ සවාමියාට සම්පත් ලැබීමද, වාසනාවන්තවීමද, සැප ලැබීමද වන්නේයයි දතයුතු.

12. කම්මුල්

යම් සත්‍රියක්හට මසින් නීනවූ කම්මුල් පිහිටියේ නම් ලෝභ හතියද මධ්‍යමලෙස ධන සැප ලැබීමද වේ. බොහෝ ලොම් ඇතුව සෘඟවූ රළුහතියෙන් කම්මුල් පිහිටියේනම් අවාසනාවන්ත වීමද නොහොත් මූසලහති ඇත්තියෙකි. මසින් පිරී මොලොක්ව වවව උස්ව කම්මුල් පිහිටියේනම් රාගාධිකවීමද සවාමියාට සම්පත් ඇතිවීමද, ඔහු යම් යම් අදහස් මොන අපදමකින් නමුත් සඵලකරගන්නා ධෛර්‍යීගතියක් ඇතිවීමද, අවංකවීමද, සියල්ලම එකාකාර ප්‍රේමාදරයෙන් ක්‍රියාකිරීමද, ඉතා යහපත් හති සිරිත් ඇතිවීමද වේ. රෝඹු නොමැතිව මොලොක්වූ කම්මුල් පිහිටියේනම් සැම කටයුතු සම්බන්ධ වාසනාවිහීනියෙකි. වඩා කෘෂ නොවුද ඉතා මහත්නොවුද නොහොත් මධ්‍යමාකාරයෙන් කම්මුල් පිහිටියේ නම් තම තම මවුපියන් නමුත් යමක් කිවු තරම්න් විශ්වාස නොකිරීමද, ඇසුවන් ප්‍රියකරනාකාර මිහිරිබස් කීමද, සත් පුරුෂ යහපත් අයෙක්යයි ලෝකයා අතර පෙන්වා අනුන්ගේ සිත් දිනනාකාර සිරිතක්ද, ඇතිවේ. නමුත් ඈ ඉතා යහපත් සත් පුරුෂ හතිගුණ ඇත්තියක් නොවේ. අනුන් රවටා තම අදහස් සඵලකරගන්නා කපටිවූ නීඝෘණ දෙණවන්තියෙකි අධිකලෙස අනුන් රවටන සිරිතකුත් තැත්තේය. එකක් සිතේ තබා වෙන යමක් අනුන්හට ප්‍රකාශකරන්නාවූ දෙගුනහතියකින් තිහරම් කල් යවන්නියක් වේ. ඉතා මහත්ව හෝ බොහෝ ඝෘඟවූ ලොම් ඇතිව කම්මුල් පිහිටියේ නම් සැම කටයුතුකිම අඟහපත් වේ. ඉන්නෙක් හෝ තලකැලලක් පිහිටියේනම් සමියාට ප්‍රියවීමද, සෙල්ලම් කාවැදියට අසතුටුවීමද, දියුණුවීමෙහි වෙහෙස දරීමද, නමුත් උත්සාහයේ ප්‍රමාණයට දියුණුව අඩුබවද, මධ්‍යමාකාර ධනසැප ලැබීම හා තරමක් පොහොසත්වීමද, ඉතා වාසනාවන්ත දෙදරුවන් ලැබීමද, එයින් අනෙක සැප ලැබීමද වේ. ලේවත් ඉන්නෙක් පිහිටියේ නම් මෙහි කී හතිගුණ අධිකවීම හා ඉතා යහපත් වාසනා ගුන ඇත්තියක් වන්නේයයි දනයුතු.

13. තොල්

යම් ස්ත්‍රියක්හට ලොකුවූ තොල් පිහිටියේ නම් යම් යම් දේ හැන කෑමයකින් හෝපවීම හා අනියතිර අදහස් ඇතිවීමද මෝඩහතියක්ද ඇතිවේ. කුඩා තොල් පිහිටියේ නම් කරුණා සිත හාවයක් පෙරදැරිව තම අදහස් සඵලකරගන්නා අරියෙන්

ක්‍රියාකිරීමද, කපටිකමින් මෝඩභාවය අහවත ගිරිතක්ද ඇත් තේය. මදක් පිපුනාකාර තොල් පිහිටියේනම් යහපත් ගති ගුණ ඇතිවේ. මඝින් පිරුණාවූ වදමලක් මෙන් රකතවණ් තොල් පිහිටියේනම් නොයෙක් සම්පත් ලැබීම හා රාගාධික වේ. සට තොල මදක් පිරුනාකාරයෙන් ගිනිදුවූ සවල්ප රේඛා ඇතුව රකතවර්ණයෙන් වටවූ තොල් පිහිටියේ නම් උත්තමඅන්නෙන් පුය බුහුමන් ලැබීමද, නාගරිවත්තවීමද, ප්‍රඛ්‍යාවීමද, සැප ලැබී මෙහි වාසකාවත්තවීමද වේ. මඝින් ගිනවූ එල්එනාකාර සට තොල පිහිටියේනම් බොහෝ දුක් ලබන්නේ වේ. කළුවණ් තොල් පිහිටියේ නම් වැහැබුවේ. සුදු කළු මිශ්‍රව තොහොත් කබරතොල් පිහිටියේ නම් රෝගාතුරවීම හා දිළිදුවේ. උඩුතොලේ රුවුලපිහි ටියේ නම් හෝ රෝම ඇත්නී වැහැබුවීමද, නිතර දෙවේලේ දුටු අයට පවා අයහපත මිස යහපතක් නොවන මූසල සත්‍රියෙකි. ඇට කෙතරම් ධනය ඇතත් ක්‍රමයෙන් විනාශවී දරුණු දුක් පැමිණීමෙන් ඉතා කාලකන්නි ජීවිතයක් ගතකරන්නේවේ ඉන් නෙක් හෝ තල කැලලක් පිහිටියේ නම් රතික්‍රීඩාවෙහි ලෙල්වී මද, දියුණුවීමෙහි යෝග්‍යවූ සපල ක්‍රියා කිරීමද එසේම දිනෙන් දින ක්‍රමයෙන් දියුණුවද නිතර සුඛාවයද ඇතිවන්නේයයි දත යුතුයි.

14. දත්.

යම් සත්‍රියක්හට මදක් රතුවූ කුඩා දත් පිහිටියේ නම් සිතූ වක්කාර ගතියද ඇගේ අදහස් මොනඅඳුමකින් නමුත් ඉවතකර ගන්නා සිරිතක්ද ඇතිවේ. දුරිදුරින් පිහිටි ලොකු දත් පිහිටියේ නම් ඉතා ධෛර්‍යවන්තගතියෙන් ක්‍රියාකිරීමද, ගව සම්පත් හා ධන රැස්කිරීමෙහි වාසනාවන්තවීමද, කැදරවූ ලෝභගති ඇති වීමදවේ. මඝත්ව තුනීව කහවණ් හෝ කහවවණ් හෝ කළුවණ් රළුවූ දත් පිහිටියේනම් දුක් ලැබීම හා අවාසනාවනත වේ පිළි වෙලකට තොමැනි අවුල්දත් පිහිටියේනම් හෝ විකාරවූ උල්දත් පිහිටියේනම් පුරුෂයා හා සමඟ නිතර දබරකිරීමද, නොහොත් සවාමියාව වදදී මැරීමද කරවන්නේය යන මේ ලක්ෂණය වැහැබූ වීමේ ලක්ෂණයකි. ඉදිරියට තෙරූ දත් හා බෙල්ලෑ දත් පිහිටි යේනම් කාරගතියද, අවාසනාවන්තවීමද, කාලකන්නිවීමද වේ. සට ඇන්දේ සහ උඩුඇන්දේ එකසරියට කිරිපාට කුඩාදත් දෙකී සක් පිහිටියේනම් ඉතා සැපලැබීම හා වාසනාවන්තවේ. උඩුඇන් දේ දත්වැඹිවිනම් ධන සැප ලැබීමද, බඩුන්හට අපලද කරයි.

යට ඇත්දේ දත්වැඩිවීනම් දුක් ලැබීමද, මැනියන් නැතිකිරිදී හෝ මවුගෙන් වෙන්වීමද වේ. සිනාවෙහි සුළුවූ වැඩුනදත් තෙ හොත් මුඛකොනකින් සිනාසෙන සිරිතක් ඇතිවීනම් යහපත් ගුණ ඇතිවේ. යම්හි නිදහසල දත්විකාරනම් නොහොත් දත් කුරු කුරුයන අනුකරණයෙන් ශබ්ද කරයි නම් ඇගේ සැමියාට විපතනියක් බව කල්පනා කරයුතු.

15. දිව.

යම් සත්‍රියක්හට රක්තවණ් දිව පිහිටියේ නම් උතුම් ගුණ වතතියක්වේ. රතු සුදු දෙකින් මිශ්‍රව මොලොක්ව හෝ සියුම්ව මහත්ව වටව අරුනුවණ්ව හෝ දිව පිහිටියේනම් පුණ්‍යවන්ත විමද ධනසැප ලැබීමද වේ. කාලවණියෙන් බොහෝ මහත්ව හෝ මැදින් පළල්ව අග මහත්ව විකෘතාකාරව පිහිටියේ නම් අයහපත්වීමද වැඳුබුවීම හා අවාසනාවනතාවේ. සිහින්වූ රක්ත වණ් දිව පිහිටියේනම් ඇසුදුවුවන් වසඟවතාකාර කවටවදන් හා මිහිරි තෙපුල් කීමෙහි සමර්ථ හකියද සත්පුරුෂවීමද වේ. මදක් නීලවණියෙන් දිව මැද පිහිටියේනම් කථාවෙහි කඩිසරවීම හා සඟබු දබරයන්හි ප්‍රිය වේ. පළල්ව හෝ අග මහත්වූ දිව පිහිටියේ නම් සම්පත් වැනසීම හා දුරිදුවේ. එල්බෙනාකාර පලල් වූ දිව පිහිටියේ නම් කෑමෙහි රිසි නොවන්නියෙක්වේ. එල්බෙන සුළුවූ දිව ඇත්ති නොකෑයුතු දේ කෑමෙහි රිසිවේ. සුදුමැලි පාටින් මදක් පටුවූ හෝ දෙකට බෙදුනාකාර මහත්වූ දිව පිහිටියේනම් කෑදරහකියද නොහොත් කැඹලාකම් කිරීමද, කේලාම් කීමද, අධම ගතිසිරින් ඇතිවීමද වන්නේයයි දතයුතු.

16. දෙතොළ.

යම් සත්‍රියක්හට රත්වන්වූ උඩුතල්ල පිහිටියේ නම් පුණ්‍ය වනතාවීමද, කෙලෙස් අඩුවීමද, පැවිදිවීමද නැතහොත් ශීලවනති යක්වේ. රත්පියුමක් මෙන් මොලොක්ව පිහිටියේනම් සෞම්‍යවූද යහපත්වූද ධනසැප ලැබීමද වේ. අතිශයින් රක්තවණ් වීනම් දුක් ලබන්නේ වේ. නීලවණ් හෝ සෙවනවණ්වීනම් දරුවන් නොලැබීමද, සම්පත් වැනසීමද වේ. නොහොත් වදමව්. කළු වණ්ව පලල්ව විශාලවූ තල්ල පිහිටියේ නම් අපුණ්‍යවනතාවීමද, දුසිරිත් ක්‍රියා ඇතිවීමද, වැඳුබුවීමද වේ. දික්ව, පළල්ව, මහත්ව රළුවූ කළුවණ් එල්බෙනාකාර යටිතල්ල ඇත්ති ඉතා දුක් ලබන්නියක් වේ. වටවීනම් සඟබු දබරාදියෙහි ප්‍රියවේ. ඇදව හෝ වකුවූව පිහිටියේනම් පාපයෙහි ඇළෙනීවේ. සිහින්ව වටව මහත්ව

රක්නවණේවූ ඇවිතල්ල පිහිටියේ නම් ඉතා සෞම්‍යවූ යහපත්ගති සිරින් ඇතිවන්නේ වේ. ඇවිතල්ලේ ඉන්නෙක් හෝ තල කැලලක් පිහිටියේනම් පළමු සැපලබා දෙවනු අන්තේකවිධ දුක් ලබන්නේඇයි දතයුතු.

17 කට සහ කථාව

යම් සත්‍රියක්හට විශාල මුඛය පිහිටියේනම් උදහරණ සහිත කථාවන් හා අනුන්ගේ සිත්දිනාගන්නාකාරයෙන්ද නොහොත් උදාරතර කථාහෙතර ඇතිවීමද වේ. මදක් ලොකුවූ මුඛය පිහිටියේ නම් අමුතු උපදවා කිමෙනි හා සහාවල්හි ප්‍රිය උපදවනාකාරයෙන්ද සමාදන කථාකිරීමෙහි සමර්ථවීමද, දක්ෂකථා ඇතිවීමද, තමා සිතුදේ කොහොම නමුත් ඉටුකිරීමද, ඔවදන්දීමෙහි දක්ෂ ශක්ති ඇත්තියක්ද වේ. කුඩාවූ මුඛය පිහිටියේ නම් වපල වචන හා ප්‍රලාපකිමද සීලාචාර අයෙක් මෙන් පෙන්වා අනුන් සතුදෙස වංචාකරගැනීමද බොරු දිවුරුන්හි දක්ෂවීමද කේලම්කිම හා සණ්ඩුදබර පරුෂවචන බැනුම් ආදිය අධිකව ඇතිවීමද, ලජ්ජා නැති ගතියද සම්‍යක්ප්‍රයෝගකාරියක්ද වේ කථාවෙහි ජරජරවූ කබල්ගඩ ඇත්ති කාලකන්නි අවාසනාවන්තියක්වේ. යම්සත්‍රියක් කථාකරණවිට මුඛයෙන් දුගීඛය පැතිරේ නම් මායා ප්‍රයෝග බහුතිබෙන භාජනයක් මෙනි. ඈ අධිකලෙස බොරුකිම හා කේලම් කියන්නියෙකි. මේ හැර දිව ගැන විස්තර කියන තැනද කථාව ගැන සවල්ප විස්තරයක් ඇතිවන්නේඇයි දතයුතු.

18. කටහඬ.

යම් සත්‍රියක්හට ඇසුවන් ප්‍රියකරනාකාර මිහිරිහඬ ඇත්තේ නම් යහපත් සිහිනුවණ ඇතිවීමද, යම් යම් දේ ගැන දක්ෂ ගති සහ අවංක ප්‍රේමාදරයෙන් මැණිගත් හා සමාන ගතියද, රාගශක්ති කවීමද, කාම සම්පත් හා ධන සැප ලැබීමද වේ. හෝඹා සහිත කටහඬ ඇත්තේනම් ඉතා දුක්ලබන්නේවේ. බෙල්ගඩ හෝ යක් කඬමෙන් නපුරුහඬ ඇත්තේනම් උඩඟුකම් ඇතිවීමද කපටි අදහසින් තම කටයුතු ඉටුකරගන්නාකාර යටහත් ගති යක් පෙන්වා ස්ත්‍රියාකිරීමද, ධන රැස්කිරීමෙහි ඉතා මහන්සි දැරීමද, තළතොහැකි තරම් කටයුතු ආදියෙහි මහන්සි දැරීමද, ඉතා ලොභ සවභාවයෙන් ධන රැස්කිරීමද, තමුන් හාර දියුණුවක් නොවීමද වන්නේවේ. පුරුෂයින්ගේ කටහඬ හා සමාන සත්‍රින්ට පිහිටියේ නම් එය අන්තේකදුක් ලැබීම හා සම්පත් වැනසීමේ ලකුණක් වන්නේඇයි දතයුතු.

19. නිකට

යම් සත්‍රියක්හට නිකට වටව පිහිටියේ නම් සිත්‍යෝගතිය හා ප්‍රඥවන්තවීමද, ස්නෙහවන්තවීමද අවංකගතිගුණ ඇතිවීමද වේ. තොල නිකට අතර වලවැටුනාක්මෙන් පිරුන නිකට පිහිටියේ නම් යථොක්ත ගතිගුණ අධික වශයෙන් ඇතිවේ. පෙතලිවූ හෝ ක්‍රමයෙන් පස්හට පැන ගියාකාර නිකට පිහිටියේනම් ප්‍රභූරක්ෂිත වීමද කෙළවරක් කැත්තාවූ අදහස් ඇතිවීමද නොහොත් උමතු ගතියෙන් ක්‍රියාකිරීමද ඇත්තේවේ. උල්ව ඉදිරියට පෙරු නිකට ඇත්නී අවුතු ඉපදවීමේහි සහ ප්‍රියතෙපුල් කීමේහි සමර්ථවීමද වංචල අදහස් ඇතිවීමද, නමුත් අවංකගති ක්‍රියා ඇතිවීමද තම අදහස් ඉටුකරගන්නා අටියෙන් කපටි සුභාවක් ඇතිවීමද වේ ඉන්නෙක් හෝ කලකැලලක් හෝ ලපයක් පිහිටියේ නම් ඇවිදීමෙහි ඇළුනාවූද සංසුංගතියද ධනවන්ත මිත්‍රයින් ලැබීම සහ වාසනාවන්ත ප්‍රිය පුරුෂයෙක් ලැබීමද දරුවන්ට නොයෙක් කැති පැමිණීමද ගමන් පිටවියාමද නොහොත් උන්හිටිතැන් වෙනස්වීමද වන්නේයයි දනයුතු.

20 මුහුණ

යම් සත්‍රියක්හට මදක් පිරුනාකාර වටවූ දුටුවන් ප්‍රියකරනා කාර නොවෙන්න් අළුතෙන් පුබුදුවූ, පියුමක්සේ ලක්ෂණවන්වූ මුහුණ පිහිටියේනම් ස්නෙහවන්නවීමද නොහොත් කරුණාධික වීමද සෙලිසෙල්ලම්හි ප්‍රියවීමද තම ගුණධර්මයන් අනුන් අතර ප්‍රකටකිරීමෙහි ආසා ඇතිවීමද ඊර්ෂ්‍යාරහිතවීමද යම්කිසිවිටක මදපාඩුවක් ඇතිවුවත් එය එලිදරව්නොකර කිසිවෙකුට නොතැකෙනාකාරයෙන් පිරිමහා ක්‍රියා කරන්නේද වේ. හොඳ කඩ වසම මුහුන පිහිටියේ නම් කම්කාන්තයන්හි කඩිසර ගතියද අනුන් ගැන සැක උපදවන සිරිතක්ද විශ්‍රම දේවල් ගැන උත්සාහ දැරීමද එසේම අදහස් ඉටුකරගැනීමද හැපෙනසුළු නොබලා ධෛර්‍ය්‍ය සිත් උපදවා දියුණුවීමෙහි අභිලාෂ ඇති එනම් අනුප්‍රාණෙන්ද්‍රිය ඇත්තියක් වන්නේය. රළුගති ඇති මුහුණේ පිහිටියේ නම් තම ලාභයම සලකා ක්‍රියාකිරීමද කෑදෝපාකාර නොබලා කන ගතියද නොහොත් නෙළෙහිගුණ නොදන්නාවූ අහක්පුරුෂ ගතියෙන් ක්‍රියාකරයි. මේවින් හිනවූ කෙට්ටු මුහුන පිහිටියේනම් රෝගාධිකවීමද වංකගතියද නීච ගතික්‍රියාද ඇතිවෙන් පැල්ලම් සහිත හෝ තාවර පෙරුනාක්මෙක් තහගාවූ මුහුන පිහි

පියේ නම් නපුරු ගතියද යම් යම් දේ ගැන අනුකම්පා රහිත බවද අහුන්ට හොඟෙකොකාරි ගතියෙන්ම අදහස් ඉටුකර ගැනීමද එසේම නම අදහස් ඉෂ්ටකරගන්නාතුරු එවෙලාවට පම ණක් ප්‍රේමය පෙන්වීමද සුරවිර දක්ෂවූ කපටිගති ඇති වැදගැබ්බ සත්‍රි යක් වන්නේයයි දතයුතු. සත්‍රීන්ගේ මුහුණේ දකුණුඅංසේ රතු ඉන්නෙක් හෝ තලකැලලක් පිහිටීම යහපත් බවත් වමේ රතු වණ ලප පිහිටීම අල්පඝුන ඇතිබවත් හැර සාමාන්‍යයෙන්ම දකුණේ ලප ගුණබවත් වමේ ලප අපලබවත් කල්පනාකටයුතුයි.

21. බෙල්ල

යම් සත්‍රියක්හට ඔඹින්වූ බෙල්ල පිහිටියේනම් දුක්ලැබීම හා දන හිඟවේ. දික්වීනම් දෙගුරුන් වැනසීම වේ. ඉතා මහත්වූ හෝ කොටව හෝ රකහවණ්ණෙන් හෝ මෙයින් යම්කිසි ආකාර යක බෙල්ල පිහිටියේනම් දුරිද්‍රවීමද දුඃඛයක් හෝ සම්භව ක්‍රියා කරන්නියෙකි. මහත්වූ බෙල්ල පිහිටියේනම් පුරුෂයා විසින් වදදී තෙරපා හරින්නීයෙක් වේ. තරමක හොඳ කඩවසම් බෙල්ල පිහිටියේ නම් සැප ලබන්නේ වේ. පළල්වූ බෙල්ල පිහි ටියේ නම් සවාමියාගේ දුක් සහසා ඒශ්වර්‍යය ලබාදී නැවත සවාමියාව නැතිකරයි. වටව පිරුන රකහවණ් නිම්ලාකාරයෙන් සතරගුලක් පමණ දික්වූ බෙල්ල පිහිටියේ නම් සම්පත් ලැබීමද පුණ්‍යවන්තවීමද කරුණාධිකවීමද වේ. සැහැල්ල ඇව නහර සහිත මසින් පිරී හොඳකාර රේඛා තුනක් පිහිටියේ නම් සවාමි යාට මැණියන්මෙන් ක්‍රියාකිරීමද වාසනාවන්තවීමද ධන සැප ලැබීමද වේ. බෙල්ලේ පිටපැත්ත නොහොත් (කුලල) මසින් පිරී මනාසේ පිහිටියේ නම් ගුණවන්තියෙක් වේ. නැමුනුකාර බෙල්ල පිහිටියේ නම් දිළිඳුඋවත් පුරුෂයාව කීකුතොකර දිළිඳු කම සහවා ක්‍රියාකරන්නියෙකි. ඇදව හෝ නහර හැමසී හෝ රෝම ඇති කුලල පිහිටියේ නම් අධමගති ගිරිත් හා අනේක දෝස් ඇත්තියෙකි. කුලලේ ලොම් සුලියක් පිහිටියේ නම් සවාමියා තසා පරපුරුෂයන් කරා යන්නී වේ. කුලලේ පිටි පස හෝ පැත්තක තලකැලලක් හෝ ඉන්නෙක් පිහිටියේ නම් සවාමියාට සම්පත් ලැබීමද පොහොසත්වීමද වාසනාවන්ත දරු වන් ලැබීමද කඩිසරගති ක්‍රියා ඇතිවීමද ධනසැප ලැබීමද වේ. බෙල්ලේ ඉස්සරහ පැත්තේ එනම් (උගුරේ) තලකැලලක් හෝ ඉන්නෙක් පිහිටියේ නම් ඇගේ පුරුෂයාගෙන් ඉතා සම්පත් ලැබීමද විශ්‍රම නම් දරිමෙකි උපතම වාසනාවන්ත දරුවන් ලැබී

මද යහපත් සිහිකුවණ හා ප්‍රඥාවත්වීමද බලවත්වූ ශරීර අව යව ඇති බවද දරුවන් ප්‍රියකරණුලද වාසනාවන්තියක් වන්නේයයි දතයුතු.

23. දෙවුර

යම් සත්‍රියක්හට පෙරට නැමුන උරහිස් පිහිටියේ නම් වාසනා වන්ත දරුවන් ලැබීම හා එයින් සැප ලබන්නේවේ. මසින්පිරුණ උරහිස් පිහිටියේනම් කාමසැපෙහි ඇළෙන්නේ වේ. සිහින්වූ කොට උරහිස් පිහිටියේ නම් බොහෝ සම්පත් ලබයි. මහත්ව හෝ වවූ උරහිස් පිහිටියේ නම් රාහයෙන් අඩුවේ. ලොකුව හෝ පහත්ව උරහිස් පිහිටියේනම් ධනසැපලැබීම හා පුණ්‍යවන්තවේ. උස්ව වවව වැහැරුණාක්මෙන් උරහිස් පිහිටියේනම් දුක්ලැබීමද කාමාධිකවීමද වැඳඹුවීමද වේ. ක්‍රමව උස්ව රෝම සහිත උරහිස් පිහිටියේනම් අනේකදුක්ලැබීම හා සවාමිඝාට මරණයද සිදුවේ. නොහොත් වැඳඹු වේ. මොලොක්වූ හම සහ මුදුන්වූ උරහිස් ඇත්නි දරුසම්පත්තියෙහි වාසනාවන්තියක් වේ. නැඹුරුව හෝ වක්වි හෝ ඉතා උස්ව මස්රහිතව හෝ සතවූ රෝම ඇතුව හෝ උරහිස් පිහිටියේනම් ඒකාන්තයෙන්ම වැඳඹුවේ. දකුණු උරේ ඉන්නෙක් හෝ උපයක් පිහිටියේ නම් සියරට හැරයාමද සියළුදෙනාට එකම්ගුනයක් ඇතිවීමද අනුන්ගේ රහස් දැනගැනීමෙහි සමර්ථවීමද කණිඤරගතියෙ හා යහපත් ගුණදම්ඇතිවේ. වම උරෙහි නම් සවල්පදේ ගැන නමුත් දබරකරණ ගතියද සවාමියා දුදරුවන් සමඟ සැපතින් කල්ගැවීමද නමුත් ඛිතුවක්කාර ගතියද කලනදී ඉතා දුක්ලැබීමද වන්නේයයි දතයුතු.

24. දෙඅත්.

යම් සත්‍රියක්හට ලොම් ඇතුව හොඳවූ අත් පිහිටියේ නම් වැඳඹුවේ. මසින් තිතවූ දික්වූ අත් පිහිටියේනම් කළුණාසයක් හි දනවේ. රෝම නොමැතිවූ මහත්වූ රතවන්වණ් දික්වූ අත් පිහිටියේනම් වාසනාවන්තවීමද කෙළිසෙල්ලම්හි ප්‍රියවීමද රාහයෙන් ලොල්වීමද නීඝණගති හා සියල්ලට එකාකාර සත්පුරුෂ ගති යෙන් ක්‍රියාකිරීමද ඇවිසවාස නොවීමද ලෝකයා අතර නමුත්වේ ගුණ කියවාගැනීමෙහි ආශාඇතිවීමද යමෙක් සමඟ ඇතිවූ ප්‍රියතා සය එවේලට පමණක් ඇතිවීමද සිතෙහි එකක් තබා නම් පුරුෂ යාකට වෙන යමක් කිමද කාෂ්ණාවෙන් හරිතවීමද වේ. වලළකර ප්‍රදේශය මසින් පිරී පිහිටියේ නම් ධන සැප ලැබීම

හා ඉතා වාසනාවන්තවේ බාහුවේ ඉන්නෙක් හෝ උපයක් පිහිටියේ නම් ධෛර්‍යවන්තකමද සාහසර භීතියද නම් විවාහයෙන් සැප ලැබීමද මේ. නමුත් සහලිස් වයසේදී මරණයද සිදුවන්නේය. වැලමිට ලඟ උඩින් ඉන්නෙක් හෝ උපයක් පිහිටියේ නම් සවාමියා සමග වෙසකිරීමද නොගෙන් අහඹුවුව කෝප රෝදු සිත් ඇති කාලකන්ණි සිතුවක්කාරියෙකි. ඇව එයේම දරුවන් ඇතිවේ වැලමිටෙ සිට මැණික් කටුව අතර ඉන්නෙක් හෝ උපයක් පිහිටියේ නම් මද වයසේදී නොගෙක් හමුවක් ලැබීමද පක්පොත් කියමිම හැර ඉතා ආසා ඇති බවද පුළුන්වන පුතෙක් ලැබීමද කරයි. මැණික්කටුවේ සිට ඇඟිලි අග දක්වා ඉන්නෙක් හෝ උපයක් පිහිටියේ නම් සුළුපට මති ගණනකදී සවාමියා මිය යන්නේය. ඒව පසු ඉතා සැප ලැබීමද වසතු විනාශද වේ. අල්ලේ ඉන්නෙක් හෝ තල කැලලක් පිහිටියේ නම් නිමියාව ප්‍රිය වන්නේයයි දනයුතු.

24 දෙ අන්ති අඟිලි.

රූප: 7 සිනිසම.

යම් සත්‍රියක් හට පියුම් කැකුලක් මෙන් රක්තවර්ණ මොළොක්ව වටව ඇද කොමිතිව අතේ මෘදවඟිල්ල පිහිටියේ නම් ඉතා වාසනාවන්තවීමද යහපත් ගති ගුණ ඇතිවීමද මේ. මෘදවඟිල්ල පටන් පිළිවෙලින් පිහිටි ඇඟිලි වටව සිහින්ව දික්ව ඇද කොමිකිව රතුවණ්ණෙන් තුඩු සහිත කෙලින් පිහිටියේ නම් පුණ්‍යවන්තවීම හා ධන සැප ලැබීමෙහි වාසනාවන්තවේ. කොටවූද වකුටුවූද සිහිදුවූද ඇඟිලි අතර සිදුරු සහිතවූද වැහැරුණුවූද මෙයින් යම් ආකාරයක හෝ කැකුළක ඇඟිලිවූවාක්ද ඇත්නම් නැම කල්හිම රෝගකාරියෙක් වේ. දුඩුමැලිවර්ණව හෝ කළුවර්ණව හෝ කහවර්ණයෙන් හෝ නෑවර පෙරුණුකාරයෙන් හෝ ඇඟිලි ඇත්නි අතේය දුක්

ලබන්නේ වේ ඇතිලි පුරුස් බොහෝ උස්ව පිහිටියේ නම් අගහපත් වන්නේ වේ.

යම් සත්‍රියක්හට හස්තාඛලිමෙන් හෝ වලවැදුනාකාරයෙන් හෝ විවර්ණව පිහිටි තිය ඇත්නී අවාඝනාවන්තියෙකි. කිබුල්වණ් යෙන් හෝ වකුටුව හෝ රළුතිය ඇත්නීගේ සම්පත් වැඩිම වන්නේවේ. තඹවණ් තිය පිහිටියේ නම් රජකියවක් මෙන් ක්‍රියාකිරි මෙහි වාඝනාවන්තියෙකි. බොහොත් පේජවන්තවීමද ප්‍රඛ්‍යවීමද ප්‍රඥාධිකවීමද උදාරතර වචන බොහෝත් ආඩම්බර කථාපුතු කිරි මද රාගයෙන් ලොල්වීමද එසින් අවතම්බු කොටනාකාර හතියෙන් ක්‍රියාකිරිමිද මූලානුවන්ත සථිර අදහස් ඇතිවීමද වේ. තියපිට සුදුපැහැති පැල්ලම් පිහිටියේ නම් කාමාසාධිකවීමෙන් පරපුරුෂයන් සේවනය කර එසින්ම ඇගේ මරණයද සිදුකර ගන්නේ වේ.

යම් සත්‍රියක්හට උස්ව බොහෝත් පිපුනාකාරයෙන් පිපිඅල්ල පිහිටියේ නම් ඇ ගහපත් වේ. ලොම්වලින් ආකුලව වැහැරුනාක් මෙන් හෝ බොහෝ මිතුවූ නහර ගැවසීගත් පිපිඅල්ල ඇත්නී දිළිඳුවීම හා වැඳඹුවන්නියයි දනයුතු.

සත්‍රීන්ගේ අල්ලේ පිහිටි රේඛා සම්බන්ධ ගුණාගුණ සාල්පයක් මෙතැන් සිට කියනු ලැබේ:-

